ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ... පරිශීලනය.

# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලයේ
ප්‍රවෘත්ති ප්‍රකාශනය

9 වන කලාපය 2 — 1988 අප්‍රේල් — ජූනි

පටුන

| | |
|---|---|
| කතුවැකිය | 1—3 |
| වී. ජී. පියදාස මහතාගේ අභාවය | 2 |
| පළාත් සභා ක්‍රමය සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවාවල අනාගත සංවිධානය | 4—9 |
| මහජන පුස්තකාලය කාගේ නිර්මාණයක්ද? | 10—12 |
| පුවත් ලුහුඬින් | 13 |
| New Vistas in Information Technology | 16—18 |
| ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය | 19 |


## පුස්තකාල විද්‍යා ප්‍රකාශන

පුස්තකාල විද්‍යාව විෂයයක් වශයෙන් හැදෑරීමටත්, එම විෂය යටතේ ලබා ගත හැකි ඉහළ සුදුසුකම් ලබා ගැනීමටත් අද දක්නට ඇත්තේ සෑහෙන තරඟකාරිත්වයකි. මෙම විෂය යටතේ පුළුල් අධ්‍යයනයක් නොලබා, පුස්තකාලයක කටයුතු කිරීමෙන්ම ලබා ඇති දැනීම් සම්භාරය පමණක් තම වෘත්තීය කටයුතු සඳහා ප්‍රමාණවත් යයි සැලකූ අවධිය දූන් අවසාන වී ඇත. මෙම තත්වය මෙම විෂය ක්ෂේත්‍රය ලබා ඇති ජයග්‍රහණයක් වශයෙන් සැලකිය හැකිය.

මෙම විෂය සම්බන්ධයෙන් කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් විවිධ මට්ටමේ පාඨමාලා පවත්වනු ලැබේ. මෙයට අමතරව, අධ්‍යාපන සේවා අමාත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තම අමාත්‍යාංශයනට අයත් පාසල් පුස්තකාල, මහජන පුස්තකාල, කාර්මික විද්‍යාල පුස්තකාලවල සේවය කරන සේවක සේවිකාවන් සඳහා කෙටිකාලීන පාඨමාලා පවත්වති. මෙම පාඨමාලාවල මූලික අරමුණ වන්නේ මෙම විෂය ක්ෂේත්‍රය සම්බන්ධ විද්‍යාත්මක අවබෝධයක් ලබා දීමත්, එම අවබෝධය ප්‍රායෝගිකව හසුරුවා ගන්නා අයුරු අවබෝධ කර දීමත්ය. මේ සඳහා මෙම ක්ෂේත්‍රයේ විවිධ අරමුණු විග්‍රහ කරමින් ප්‍රකාශිත පොත් පත් අවශ්‍ය ය. මෙම පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් හදාරන අයට අවශ්‍ය තරමට ඒ පිළිබඳ ප්‍රකාශිත ඉංග්‍රීසි කෘති ඇතත්, සිංහල භාෂා මාධ්‍යයෙන් මෙම විෂය ක්ෂේත්‍රය හදාරන ඉංග්‍රීසි මඳ දැනුමක් ඇති අයට ලිඛිත සාහිත්‍යයේ අඩුව ප්‍රබල අභියෝගයක් වී ඇත.

වාර්ෂික දායක මුදල රු. 20-00 යි.

මිල රු. 5-00 යි.



# පී. ජී. පියදස මහතාගේ අභාවය

කැලණිය විශ්ව විද්‍යාල පුස්තකාලයේ දීර්ඝ කාලයක් ප්‍රධාන පුස්තකාලයාධිපති වශයෙන් කටයුතු කොට මෑතකදී විශ්‍රාම ලැබූ දිවයිනේ ප්‍රමුඛ පෙළේ පුස්තකාලයාධිපතිවරයකු වූ පී. ජී. පියදස මහතා පසුගියදා අභාවප්‍රාප්ත විය. මිය යන විට ඒ මහතාගේ වයස අවුරුදු 68 ක් විය.

ගාල්ලේ අහංගම රෝහණ විද්‍යාලයයෙන් මූලික අධ්‍යාපනය ලැබූ පියදස මහතා පසුව ගාල්ලේ ශාන්ත ඇලෝසියස් විද්‍යාලයයේ සහ කොළඹ ආනන්ද විද්‍යාලයයේ අධ්‍යාපනය ලැබීය. වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා ඉන්දියාවට ගිය ඒ මහතා ඉන්දියාවේ කල්කටා විශ්ව විද්‍යාලයෙන් ඉතිහාසය පිළිබඳ විශේෂ උපාධියක් ලබා ගත්තේය. ආපසු ලංකාවට පැමිණ පළමුවෙන් ම ගුරු වෘත්තියට බට පියදස මහතා කැලණිය ගුරුකුල විද්‍යාලයයේ ගුරුවරයෙකු ලෙසත්, පසුව 1948 සිට 1959 දක්වා එම විද්‍යාලයයේ ම විදුහල්පතිවරයා ලෙසත් කටයුතු කරන ලදී.

1959 වසරේ කැලණිය විශ්ව විද්‍යාලය (එවකට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය) ආරම්භයේ දීම එහි සහකාර පුස්තකාලයාධිපතිවරයකු වශයෙන් සේවයට බැඳෙමින් පළමුවරට පුස්තකාල ක්ෂේත්‍රයට ඇතුළු විය. පසුව වැඩිදුර අධ්‍යාපනය සඳහා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා අංශයට බැඳුණු ඒ මහතා එහිදී පුස්තකාල විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගති. 1964 වසරේ දී පියදස මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති වශයෙන් පත් විය.

කැලණිය විශ්ව විද්‍යාලයයේ පුස්තකාලයාධිපතිවරයා ලෙස කටයුතු කළ දීර්ඝ කාලය තුළදී එහි දියුණුවට ඉමහත් සේවාවක් එතුමා අතින් ඉටු විය. නව පුස්තකාල ගොඩනැගිල්ලක් ලබා ගැනීමටත්, පුස්තකාලය විද්‍යානුකූලව සංවිධානය කිරීමටත්, පුස්තකාලයට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ලබා ගැනීමටත්, පුළුල් පුස්තකාල කාර්ය මණ්ඩලයක් ලබා ගැනීමටත් එතුමා සමත් විය.


(20 වැනි පිටුව බලන්න.)

සිංහල භාෂාවෙන් මෙම විෂය ක්ෂේත්‍රය සම්බන්ධව පළ වන පොත පත ප්‍රකාශනය වීම බෙහෙවින්ම සීමිත වී ඇත. එසේ වුව ද මෙම භාෂා මාධ්‍යයෙන් මෙම විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කරන පිරිස වසරින් වසර වැඩිවී තිබේ. පසුගිය දශකයක පමණ කාලය ගතහොත් ඇතැම් වර්ෂ වලදී මෙම විෂය යටතේ දේශීය වශයෙන් එකම ග්‍රන්ථයක් වත් පළ නොවූ වර්ෂ දක්නට ලැබේ.

විෂය ක්ෂේත්‍රයක ස්ථාවරත්වයටත්, එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ විවිධ මත පළවීම සඳහාත් එයට අදාලව ලිඛිත සාහිත්‍යයක් බිහිවීම අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුත්තකි. ලිඛිත සාහිත්‍යය මගින් ස්ථාවරව අදහස් ප්‍රකාශ කිරීමක් සඳහා ලේඛකයාට අවස්ථාවක් සැලසේ. ලිඛිත සාහිත්‍යය නිසා එම විෂය ක්ෂේත්‍රයේ පැවැත්ම වඩාත් අර්ථවත් වේ. යම් විෂයයක් පිළිබඳ කෘති ප්‍රකාශයට පත්වන ආකාරයෙන් එම විෂය පිළිබඳව සමාජයේ දක්නට ලැබෙන නැඹුරුව ද වටහා ගත හැකිය.

පුස්තකාල විද්‍යාව පිළිබඳ දේශීය වශයෙන් පළවී ඇති ග්‍රන්ථවල අඩුව පිරිමසාලීම සඳහා අර්ථවත් අයුරින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග කිහිපයක් ම ඇත. වෙනත් භාෂාවලින් ප්‍රකාශිත, මෙම විෂයට අදාල සම්භාවනීය ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කිරීම එක් ක්‍රියා මාර්ගයකි. මෙම විෂය ක්ෂේත්‍රයේ විවිධ අරමුණු, නව නැම්යාවන්, දේශීය වශයෙන් පවතින ගැටලු විස්තර කරන හා සාකච්ඡා කරන ග්‍රන්ථ රචනා කිරීම ද තවත් ක්‍රියා මාගීයකි. මෙම ප්‍රකාශන මගින් මෙම විෂය අධ්‍යයන කරන අයගේ දැනීම පුළුල් වන ආකාරයේ ලිඛිත සාහිත්‍යයන් බිහිවන අතර, මෙම ලිඛිත සාහිත්‍යය තුළින් විවිධ අදහස් හුවමාරු වීමත්, විෂය ක්ෂේත්‍රය පිළිබඳ වැඩි උනන්දුවක් ඇති වීමත්, නිතැතින්ම සිදුවේ.

දේශීය ලිඛිත සාහිත්‍යයක් මෙම විෂය පිළිබඳ ඇති කරලීමට විෂය පිළිබඳ ප්‍රවීණයන් උනන්දු නොවන්නේ මන්ද යන්න මෙහිදී මතුවන වැදගත් ප්‍රශ්නයකි. මෙයට එක් හේතුවක් වශයෙන් අපට හැගී යන්නේ එවැනි කාර්යයකට අත ගැසීමෙන් පසු එළි දකින අත් පිටපත ප්‍රකාශයට පත්කර ගැනීමේ අසීරුතාවය යි. පසුගිය වසර දෙක තුන තුලදී සෑම වසරක ම මෙම ක්ෂේත්‍රයට අලුතින් ග්‍රන්ථ ගණනාවක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය එක් කළ අතර, මෙම වසරේ සිට එම ග්‍රන්ථ සංඛ්‍යාව තවත් වැඩිකර ලීමට කටයුතු කර ඇත. පුස්තකාල හා විඥපන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් දරන පුස්තකාලයාධිපතීන් රචිත, අන්තර්ගතය අතින් අර්ථවත්, එමෙන්ම කාලීන වශයෙන් වැදගත් අත්පිටපත් ප්‍රකාශනයෙහිලා අප මණ්ඩලය සහාය වන බව පසුගිය වසර කිහිපය තුළම අප දක්වා ඇත. ඒ අනුව මෙම විෂය පිළිබඳ දේශීය ලිඛිත සාහිත්‍යයක වර්ධනය සඳහා විෂය ප්‍රවීණයන්ට පුස්තකාල සේවා මණ්ඩලය සමග එක්වන ලෙස විවෘත ආරාධනාවක් කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු.




# මණ්ඩලීය ප්‍රකාශන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් 1977 දී ප්‍රථම වරට පළ කරන ලද 'මහජන පුස්තකාල ප්‍රමිති' ග්‍රන්ථයේ දෙවන මුද්‍රණය ප්‍රකාශයට පත් වී ඇත.

මහජන පුස්තකාල සේවය ක්‍රමවත්ව සංවර්ධනය කිරීමෙහිලා පිළිපැදිය යුතු උපදෙස් මාලාවකින් සමන්විත මෙම ග්‍රන්ථය, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ව්‍යාපාරය සීඝ්‍රයෙන් දියුණුවන මෙම අවධියේදී පුස්තකාලයාධිපතීන්ට, පුස්තකාල විද්‍යා ශිෂ්‍යයින්ට හා පුස්තකාල අධිකාරීන්ට මග පෙන්වන මහඟු ග්‍රන්ථයකි. මෙහි සඳහන් වන්නේ ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලද්දද වූ ද, දැනට බොහෝ රටවල අනුගමනය කරනු ලබන්නා වූ ද, ප්‍රමිති මාලාවකි.

මෙය ජාත්‍යන්තර පුස්තකාල සංගම් සංවිධානය මගින් පළ කළ 'STANDARDS FOR PUBLIC LIBRARIES' ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයයි.

# පළාත් සභා ක්‍රමය සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවාවල අනාගත සංවිධානය

මෑතකදී හඳුන්වා දුන් පළාත් සභා ක්‍රමය සමගම ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පරිපාලනයේත්, පළාත් පාලනයේත් විශාල වෙනසක් ඇති විය. මෙතෙක් පැවති ඒකීය පාලන ක්‍රමය වෙනුවට ඒකීය රාජ්‍යයක් ඇතුලත විකේන්ද්‍රීය පාලන ක්‍රමයක් මේ මගින් හඳුන්වා දී තිබේ.

පළාත් පාලනය පසුගිය දශක කිහිපය තුළ දිවයිනේ විවිධ අන්දමේ වෙනස්වීම්වලට භාජනය වූ ක්ෂෙත්‍රයකි. 1981 දක්වාම ගම්සභා, සුළු නගර සභා, නගර සභා, මහ නගර සභා යන පාලන ඒකකවලින් සැදුම්ලත් පරිපාලන ක්‍රමයක් පැවතිණි. 1981 දී පළාත් පාලනය තව දුරටත් විකේන්ද්‍රීය කිරීමේ අභිලාෂයෙන් සංවර්ධන සභා ක්‍රමය හඳුන්වා දෙන ලදී. පැරණි පළාත් පාලන ක්‍රමයේ පහළ මට්ටමේ වූ ගම්සභා හා සුළු නගර සභා, අහෝසි වී ඒ වෙනුවට සංවර්ධන සභා ඇති කරන ලදී.

පළාත් පාලන ක්‍රමය කුමන ආකාරයකින් තිබුණත් ලංකාවේ සාමාන්‍ය පරිපාලනය මීට වඩා වෙනස් අන්දමකින් මුල පටන් ක්‍රියාත්මක විය. බ්‍රිතාන්‍ය පාලන සමය තුළදී රටේ පළාත් මුල් කරගත් පාලන ක්‍රමයක් පැවතිණි. නිදහස ලැබුවාට පසු සාමාන්‍ය පරිපාලනය ප්‍රධාන වශයෙන්ම දිස්ත්‍රික්ක පදනම මත සිදුවුණි. දිස්ත්‍රික්ක මට්ටමින් කිසිදු පළාත් පාලන ආයතනයක් නොතිබුණද මධ්‍යම ආණ්ඩුව විසින් සියලුම පරිපාලන කටයුතු දිස්ත්‍රික් මට්ටමින් කරන ලදී. දිසාපති ඇතුළු නිලධාරීහු පාලන ක්‍රමයට සම්බන්ධ වූහ. මෙම දිස්ත්‍රික්ක මට්ටමින් පැවති පරිපාලන ක්‍රමයේ වැදගත් වෙනසක් 1974 වසරේ විමධ්‍යගත අයවැය හඳුන්වාදීමත් සමගම ඇරඹිණි. මේ මගින් ප්‍රාදේශීය වශයෙන් ප්‍රථම වරට සැළසුම් ක්‍රියාත්මක කිරීම පමණක් නොව සැළසුම් සකස් කිරීමේ වගකීමද හඳුන්වා දෙන ලදී. මේ අන්දමට විවිධ මට්ටම් වලින් පැවති පළාත් පාලන ක්‍රමයත්, දිස්ත්‍රික් මට්ටමින් පැවති සාමාන්‍ය පරිපාලන ක්‍රමයත් මෑතක් වනතුරු ලංකාවේ පොදු ලක්ෂණයක් විය.

නව පළාත් සභා හඳුන්වා දීමේ මූලික පදනම විවිධ ජන කොටස් වලින් සමන්විත ඒ ඒ ප්‍රදේශවල ජනතාවට තමන්ගේ කටයුතු පිළිබඳව සැලකිය යුතු මට්ටමක ස්වයං පාලනයක් ලබා දීම බව අපි දනිමු. 1981 හඳුන්වා දුන් සංවර්ධන සභා ක්‍රමයත්, එයට ගැලපෙන සේ සකස් කොට හඳුන්වා දුන් ප්‍රාදේශීය මණ්ඩල හා ග්‍රාමෝදය මණ්ඩල ක්‍රමයත් මගින් සැලකිය යුතු තරම් පාලන බලතල විමධ්‍යගත නොවීම නව ක්‍රමය ඇති වීමට බලපෑ මූලික හේතුවක් ලෙස දක්වේ. මේ අනුව සංවර්ධන සභාවලට වඩා පුළුල් බලතල සහිත පාලන ක්‍රමයක් ඇති කරලීමට සිදු විය. නව පළාත් සභා ක්‍රමය මෙහි ප්‍රතිඵලය විය.

පළාත් සභා ක්‍රමය යටතේ ප්‍රධාන බලතල කොටස් 03 කින් සමන්විත වී ඇත.

අ. මධ්‍යම ආණ්ඩුව සතුව ඇති බලතල

ආ. පළාත් සභාව සතුව ඇති බලතල

ඇ. මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව සහයෝගයෙන් ක්‍රියාත්මක කළ යුතුව ඇති බලතල

මීට පෙර පැවති සංවර්ධන සභා ක්‍රමය යටතේ සංවර්ධන සභා සතුවූ බලතල හා පළාත් සභා බලතල අතර එක් වරම පෙනෙන වෙනසක් ඇත. සංවර්ධන සභා ක්‍රමය යටතේ විෂයයන් 15 ක් පිළිබඳ පුළුල් බලතල සංවර්ධන සභාවට ලැබුණි. මෙම බලතල ඉතාමත් පුළුල් ඒවා වුවද එම බලතල ක්‍රියාත්මක කිරීමේලා අවශ්‍ය මුදල් සඳහා බොහෝ දුරට මධ්‍යම ආණ්ඩුව මත යැපීමට සිදුවීම එහි පැවති ප්‍රධාන දුර්වලතාවයකි. සෘජු මුදල් ප්‍රතිපාදන නොමැතිව බලතල පැවරීමෙන් පමනක් අදාල බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම අපහසු බව පසුගිය වසර කිහිපය තුළ ලැබූ අත් දැකීම් වලින් පෙනුණි.

මෙම දුබලතාව පළාත් සභා ක්‍රමයේදී ඉවත් කිරීමට පුළුල් ප්‍රයත්නයක් දරා ඇති බව පළාත් සභා පනත විමසීමේදී පෙනී යයි. පළාත් සභාවල කටයුතු නිසි පරිදි කරගෙන යාම සඳහා මුදල් ලැබෙන මාර්ග ගණනාවක් පිළිබඳ පළාත් සභා පනතේ දක්වා ඇත. ප්‍රධාන මාර්ග 4 කින් පළාත් සභාවලට මුදල් සැපයේ.

අ. ඒ ඒ පළාත ඇතුලත බදු අය කිරීම.

ආ. මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව හවුලේ අය කරනු ලබන බදු.

ඇ. මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් ලබා ගැනීම.

ඈ. විදේශ ආධාර සහ වෙනත් විදේශ මුදල් ලබා ගැනීම.

මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර හවුලේ බදු අය කර ගැනීම

## එම්. එස්. යූ. අමරසිරි

නියෝජ්‍ය අධ්‍යක්‍ෂ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.


---

පිළිබඳව කරුණු පැහැදිලි කිරීමට ස්ථිර මූල්‍ය කොමිසමක් පත් කළ යුතු බව පනතේ දක්වා ඇත.

නව පළාත් සභා ක්‍රමය සමග පළාත් පාලන පුස්තකාල ක්‍ෂෙත්‍රයේ විශාල වෙනස්කම් බලාපොරොත්තු විය හැක. පළාත් පාලන ක්‍රමයේ ඒකක වශයෙන් පැවති විවිධ පළාත් පාලන ඒකක වෙනුවට ඒ ඒ ප්‍රදේශවල තනි පාලන ඒකකයක් තිබීම පුස්තකාල සේවාව නව මං ඔස්සේ ව්‍යාප්ත කිරීමට ඉතා හොඳ ආධාරකයක් වනු ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1981 වසරේ දිස්ත්‍රික් පුස්තකාල හඳුන්වාදීම දේශීය මහජන පුස්තකාල සේවාව සම්ප්‍රදායික තත්වයෙන් මිදීමට දරනු ලැබූ ප්‍රථම ප්‍රයත්නය ලෙස හැඳින්විය හැක. මේ මගින් කුඩා පළාත් පාලන ආයතන රාශියක විමධ්‍යගතව පැවති දුර්වල පුස්තකාල සේවාව, දිස්ත්‍රික් මට්ටමින් කේන්ද්‍රියගත කිරීමේ ප්‍රයත්නයක් දරන ලදී. සෑම දිස්ත්‍රික්කයකටම දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාලයක් නම් කරනු ලැබූ අතර එම මධ්‍ය පුස්තකාලය මව් පුස්තකාලය වශයෙන් සලකා දිස්ත්‍රික් මට්ටමින් පුස්තකාල සේවාව සංවර්ධනය කිරීමට ප්‍රයත්නයක් දරන ලදී. දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය දුර්වල වීමට බලපෑ හේතුවක් වූ මුදල් ප්‍රශ්නය, දිස්ත්‍රික් පුස්තකාල සේවාව දුර්වල වීමට බලපෑ ප්‍රධාන හේතුව ද විය. දිස්ත්‍රික් මට්ටමින් පළාත් පාලන ආයතනයක් නොතිබීම මෙහි දී බල පෑ තවත් දුබලතාවයක් විය. මේ නිසා දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාලයට, වෙනත්, සීමිත බලතල ඇති පළාත් පාලන ආයතනයකට සම්බන්ධ වී කටයුතු කිරීමට සිදු විය. මේ අන්දමට දිස්ත්‍රික් පුස්තකාල වලට ස්ථිර මුල්‍යමය හා නීතිමය පදනමක් නොමැතිවීම එහි සීමිත සාර්ථකත්වයට බලපෑ හේතු ලෙස සැලකිය හැක.

නව පළාත් සභා ක්‍රමය යටතේ මෙම දුබලතා දෙක ම ඉවත් වී ඇති බව පෙනේ. පළාත් සභා පනත මගින් නිශ්චිතව පළාත් සභා පිහිටුවීමත්, ඒවාට පුළුල් සහ නිශ්චිත බලතල පැවරීමත් නිසා ශක්තිමත් නීතිමය පදනමක් පළාත් සභාව සතුව ඇත. ඒ ඒ ප්‍රදේශවල ජන්දයෙන් තෝරනු ලබන මන්ත්‍රීන් ගෙනුත්, මන්ත්‍රීන් විසින් තෝරාගනු ලබන මහ ඇමතිතුමා හා ඇමති මණ්ඩලයෙනුත්, ජනාධිපති තුමා පත්කරනු ලබන ආණ්ඩුකාරවරයෙකුගෙනුත්, සමන්විත වන පළාත් සභාවල ව්‍යවස්ථාදායක සහ විධායක බලතල පැහැදිලිව දක්වා ඇත. මීට අමතරව පළාත් සභාවලට ලබා දී ඇති මුල්‍ය ප්‍රතිපාදන හා මුල්‍ය බලතල නිසා තමන් සතුව ඇති බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ හැකියාව පළාත් සභා වලට ලැබී ඇත. මේ පසුබිම යටතේ පළාත් සභා සම්බන්ධ කොට ගෙන බිහිවන නව පුස්තකාල ක්‍රමයක් පැහැදිලිවම සාර්ථක වන ලකුණු දැකිය හැක.


මෙහිදී වැදගත් වනුයේ කුමන ආකාරයක පුස්තකාල රටාවක් ඒ ඒ පළාත්වල ඇති කළ යුතුද යන්නයි. පළාත් සභාවලට දී ඇති බලතලවල පුස්තකාල සේවාවන් පවත්වා ගෙන යාම පිළිබඳ විශේෂ සඳහනක් කර නොමැති බව දැක්විය යුතුය. එසේ වුවද ඒ ඒ පළාත්වල අධ්‍යාපනය, සංස්කෘතිය හා පළාත් පාලනය පිළිබඳ පුළුල් බලතල පළාත් සභාව සතුවන බැවින් යහපත් හා ශක්තිමත් පුස්තකාල සේවාවක් සංවිධානය කිරීමට පළාත් සභාවට හැකියාව තිබෙන බව පැහැදිලිවම පෙනේ. සෑම පළාතක්ම දිස්ත්‍රික්ක කිහිපයකින් සමන්විත වී ඇත. එය බොහෝ අවස්ථාවල දිස්ත්‍රික්ක තුන කින් සමන්විත වේ. මේ තත්වය යටතේ දිස්ත්‍රික් පුස්තකාල වඩාත් ශක්තිමත්ව තවදුරටත් පවත්වා ගෙන යාමේ හැකියාව තිබෙන බව පෙනේ. මෙම දිස්ත්‍රික් පුස්තකාලවලට අමතරව මුළු පළාතට ම සම්බන්ධ ප්‍රධාන ප්‍රාදේශිය පුස්තකාලයක් ගොඩනැගීමට නව ක්‍රමය යටතේ අවකාශ ලැබේ.

මෙම ප්‍රධාන පුස්තකාලයට ඒ ප්‍රදේශයේ කුඩා ජාතික පුස්තකාලයක් ලෙසද කටයුතු කළ හැක. එය මහජන පුස්තකාලවල පමණක් නොව සෑම පුස්තකාල ක්‍ෂෙත්‍රයකම මව් පුස්තකාලය ලෙස කටයුතු කිරීම අවශ්‍ය වේ. ප්‍රාදේශීය සභාව මගින් සෘජුවම මුල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අවකාශ ඇති බැවින් මෙබඳු පුස්තකාලයක් පවත්වා ගෙන යාම අපහසු නොවේ. ජාතික වශයෙන් ජාතික පුස්තකාලයටත්, ප්‍රාදේශීය වශයෙන් දිස්ත්‍රික් පුස්තකාල හා අනෙක් පුස්තකාල වලටත් මෙය සම්බන්ධ වේ.

ප්‍රාදේශීය පුස්තකාලය මුල් කර ගත් පළාත් සභා පුස්තකාල ව්‍යුහය පහත දැක්වෙන අන්දමට පැහැදිලි කළ හැක.

# ප්‍රාදේශීය පුස්තකාල සේවාවක

## යෝජිත ව්‍යුහය




ප්‍රාදේශීය පුස්තකාලයක වගකීම හා කාර්යයන් ප්‍රධාන අංශ කිහිපයක් යටතේ සලකා බැලිය හැක. මෙහිදී ප්‍රාදේශීය පුස්තකාලය ලෙස හැඳින්වෙන්නේ ප්‍රාදේශීය පුස්තකාලයත්, එම පුස්තකාලයේ පාලන කටයුතු සඳහා පළාත් සභාව මගින් පත් කරනු ලබන අදාල අධිකාරි ආයතනයත් වේ.

පළාතේ ප්‍රධාන පුස්තකාලය ලෙස විශාල පොත්පත් සහ වෙනත් පුස්තකාල ද්‍රව්‍ය එකතුවක් පවත්වාගෙන යාම ප්‍රාදේශීය පුස්තකාලයේ ප්‍රධාන වගකීම වේ. මේ මගින් එක් අතකට පුස්තකාලයට පැමිණෙන පාඨකයින්ට උසස් මට්ටමේ පුස්තකාල පහසුකම් සපයන අතර අනෙක් අතට පළාතේ සියලුම පුස්තකාලවලට අවශ්‍ය අමතර සම්පත් සපයන මධ්‍ය පුස්තකාලයක් ලෙස කටයුතු කරලීමට හැකිවේ. පාඨකයාට සහ පුස්තකාලවලට සේවය කිරීමේ මෙම ද්විත්ව වගකීම ප්‍රාදේශීය පුස්තකාලයක විශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැක.

ප්‍රාදේශීය පුස්තකාලය පළාතේ ප්‍රධාන මහජන පුස්තකාලය නොවන බව මෙහිදී අවධාරණය කළ යුතු වේ. එය පොදුවේ සියලුම වර්ගවල පුස්තකාල සේවාවල කේන්ද්‍රස්ථානය විය යුතු වන අතර, මේ නිසා එය බොහෝ දුරට කුඩා ජාතික පුස්තකාලයක ස්වරූපයට සමාන වේ. මේ අනුව පළාතේ මහජන පුස්තකාල මෙන්ම පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල, කාර්මික ආයතන පුස්තකාල, පිරිවෙන් පුස්තකාල, විශේෂ පුස්තකාල, ස්වේච්ඡා සංවිධාන පුස්තකාල, විශ්ව විද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන පුස්තකාල, ආරාම පුස්තකාල වැනි සියලුම වර්ගවල පුස්තකාලවල මධ්‍ය පුස්තකාලය ලෙස කටයුතු කිරීම ප්‍රාදේශීය පුස්තකාලයක වගකීම වේ.

සියලුම පුස්තකාල සේවාවල මධ්‍ය පුස්තකාලය වීමෙන් වගකීම් රැසක් ප්‍රාදේශීය පුස්තකාලය සහ ප්‍රාදේශීය පුස්තකාල අධිකාරිය සතු වේ. පළාතේ පුස්තකාල සේවාව විධිමත්ව සැලසුම් කරලීමට හැකිවීම මෙහිදී ඇති ප්‍රධාන වාසි සහගත කරුණ වේ. මෙතෙක් විවිධ අංශවල පුස්තකාල සේවාවන් මෙන් ම එක ම අංශයක විවිධ පුස්තකාල හුදෙකලාව කටයුතු කිරීම පොදුවේ පුස්තකාල ක්ෂෙත්‍රයේ දියුණුවට පැවති ප්‍රධාන බාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

මේ තත්වය මඟ හරවා පුස්තකාල සේවාව සංවර්ධනය කිරීම සඳහා පළාතේ සියලුම පුස්තකාල ක්ෂේත්‍ර ඇතුළත් එක් පුස්තකාල සැලැස්මක් සකස් කරලීමට ප්‍රාදේශීය පුස්තකාලයට සහ පළාත් සභාවට හැකිවේ. මෙහිදී පුස්තකාල සඳහා යෙදවිය හැකි සියලුම සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගත හැකි සේ යෙදවීමටත්, විවිධ පුස්තකාල සහයෝගිතා ක්‍රම මගින් උපරිම ප්‍රතිඵල ලබාගැනීමටත් අවස්ථාව සැලසේ.

ප්‍රාදේශීය පුස්තකාලය භූගෝලීය වශයෙන් කුඩා ප්‍රදේශයකට සේවය කරලීමත්, එම ප්‍රදේශය නැවතත් දිස්ත්‍රික් පුස්තකාල යටතේ අනු කොටස් වශයෙන් සංවිධානය වීමත් නිසා පුස්තකාල ක්ෂේත්‍රයේ නව සංවිධාන කටයුතු සැලසුම් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් පහසු වේ. මුළු ප්‍රදේශයේම පුස්තකාල ඇතුළත් ප්‍රධාන පුස්තකාල ජාලයට (network) අමතරව ඒ ඒ දිස්ත්‍රික්කවල පුස්තකාල සඳහා වෙනම පුස්තකාල ජාලත්, ඒ ඒ විෂය ක්ෂේත්‍ර අනුව අනු පුස්තකාල ජාලත්, ප්‍රාදේශීය පුස්තකාලය මධ්‍යස්ථානය කොට ගෙන සංවිධානය කළ හැකි වේ. සීමිත භූගෝලීය ප්‍රදේශයකට විශේෂ අවධානය යොමු කරලීමෙන් පුස්තකාල සංවර්ධනය කෙතරම් වේගවත් කළ හැකිද යන්නට හොඳම නිදසුන ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යුනෙස්කෝවේ ආධාර ඇතිව ක්‍රියාත්මක කළ මහනුවර දිස්ත්‍රික්කයේ නියාමක පුස්තකාල ව්‍යාපාරය (1972 — 1976) වේ. අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කළ සියවස පුස්තකාල ව්‍යාපාරයේත් (1969 — ), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සහ පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියාත්මක කළ දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල ව්‍යාපාරයේත්, (1982 —) දුබලතා මැද වුවද මෙම ලක්ෂණය පැහැදිලි ලෙස දක්නට ලැබුණි.

ප්‍රාදේශීය පුස්තකාල කේන්ද්‍රීය කොට ගෙන දිවයිනේ පළාත් නවය තුළ සැලසුම් සහගත වැඩ පිළිවෙළවල් නිසි ලෙස ක්‍රියාත්මක වුවහොත් එය අප රටේ පුස්තකාල සංවර්ධනයේ නව නැම්මක් වනු ඇත.

පුස්තකාල විද්‍යාවේදීන් වශයෙන් සාමූහික සහ සැලසුම් සහගත ක්‍රියාදාමයකින් පුස්තකාල සේවාවට සිදුවන මෙහෙය ගැන අප සියලු දෙනාම දනිමු. සාමූහික ප්‍රතිග්‍රහණය මගින් එක් එක් විෂය ක්ෂේත්‍රවලට අදාල පොත් ලබාගැනීම පුස්තකාල එකකට හෝ කිහිපයකට පැවරීමෙන් වැඩි පුස්තකාල ද්‍රව්‍ය ප්‍රමාණයක් පළාතේ පාඨක ජනතාව සඳහා ලබාගැනීමට හැකියාව ලැබේ. පළාතේ පුස්තකාල අතර යහපත් අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමයක් ප්‍රාදේශීය පුස්තකාලයේ මූලිකත්වයෙන් ඇරඹීම මේ තත්වය යටතේ පහසු කාර්යයක් වනු ඇත. දැනට අන්තර් පුස්තකාල පිරුළු සේවාවක් ඇරඹීමට බාධක ලෙස පවත්නා, පුස්තකාල විවිධ පාලන ආයතන යටතේ පැවතීම, භූගෝලීය විෂමතා, පොදු පුස්තකාල සැලැස්මක් නොමැතිවීම වැනි බාධක ප්‍රාදේශීය පුස්තකාල සේවයේදී තවදුරටත් නොපවතිනු ඇත. මේ තත්වය යටතේ ප්‍රදේශයේ පුස්තකාලවල ඇති සම්පත් පිළිබිඹු කෙරෙන ප්‍රාදේශීය ඒකාබද්ධ සූචියක් සැකසීම ප්‍රාදේශීය පුස්තකාලයේ ප්‍රධාන කාර්යයක් වනු ඇත.

එක් මධ්‍යස්ථානයකින් පොත් මිල දී ගෙන අදාල තාක්ෂණික සේවාවන් ඉටු කොට පුස්තකාල අතර බෙදා හැරීම උතුරු යුරෝපයේ කුඩා රටවල් ගණනාවක බෙහෙවින් සාර්ථකව ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් වේ. දැනට දේශීය වශයෙන් අධ්‍යාපන සේවා අමාත්‍යාංශය සහ පළාත් පාලන අමාත්‍යාංශය පිළිවෙලින් පාසල් සහ මහජන පුස්තකාල සඳහා සීමිත ලෙස මෙවැනි මධ්‍යගත මිල දී ගැනීම් කරනු ලබයි. ප්‍රාදේශීය පුස්තකාල තම පළාතේ පුස්තකාල සඳහා මෙබඳු මධ්‍යගත මිළ දී ගැනීමේ වැඩ පිළිවෙළක් ඇරඹීම සෑම අතින්ම කාලෝචිත බව පෙනේ. එකවර විශාල පිටපත් ප්‍රමාණයක් මිල දී ගන්නා නිසා පොත් ප්‍රකාශකයින්ගෙන් සැලකිය යුතු කොමිස් මුදලක් ලබා ගැනීමට හැකිවන අතර ඒ අනුව අඩු මිලකට පොත් ලබා ගැනීමේ හැකියාව පුස්තකාලවලට හිමිවේ. එමෙන්ම විවිධ විෂය ක්ෂේත්‍රවලට අදාල පොත් ඒ ඒ පුස්තකාල විසින් මිලයට ගැනීමේ සැලසුම් සහගත ක්‍රමයක් මුලදී සඳහන් කළ අන්දමට මැනවින් ක්‍රියාත්මක කරලීම මෙබඳු මධ්‍යගත මිල දී ගැනීමකදී පහසුවේ. පොත් බැඳීම්, ලැමිනේට් කිරීම, පොත් සාක්කු, දින පත්‍රිකා, පොත් තුණ්ඩු සකස් කිරීම් වැනි තාක්ෂණික සේවාවන්ද මේ සමගම ප්‍රාදේශීය පුස්තකාලයේදී ඉටු කිරීමෙන් අනෙක් පුස්තකාලවලට ඇතිවන පහසුව ඉතා විශාල වේ. තාක්ෂණික සේවාවලට අමතරව සූචි පත්‍රිකා සම්පාදනයද මධ්‍යගතව ඉටු කළ හැකි අතර එමගින් පළාතේ සෑම කුඩා පුස්තකාලයකම පොත් නිවැරදිව සහ සමානුරූපීව සූචිගත වන බවට සහතික කරගත හැක. ප්‍රාදේශීය ඒකාබද්ධ සූචිය පහසුවෙන් සකස් කරලීමටත් ඒ මගින් ජාතික පුස්තකාලයට ජාතික ඒකාබද්ධ සූචිය පහසුවෙන් සකස් කිරීමටත් මෙයින් අවකාශ ලැබේ.

ප්‍රාදේශීය පුස්තකාල මේ අන්දමට මධ්‍යගත මිල දී ගැනීම් ක්‍රමයක් ඇරඹුවහොත් දේශීය ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයට අත්වන වාසිය අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නව ප්‍රකාශනයකින් පිටපත් දහසක් හෝ ඊට ආසන්න ප්‍රමාණයක් මිල දී ගැනීම මගින් පසුගිය වසර කිහිපය තුළ දේශීය ප්‍රකාශන ක්ෂෙත්‍රයට ලබා දී ඇති නව ජීවය ප්‍රකට කරුණකි. විමධ්‍යගත ආයතන නවයක් මගින් මේ ආකාරයට පුළුල් වශයෙන් පොත් මිල දී ගැනීමෙන් දේශීය ප්‍රකාශන ක්ෂෙත්‍රයේ උන්නතියට විශාල මෙහෙයක් කළ හැක.

පුස්තකාල සේවාව සඳහා අත්‍යවශ්‍ය, එහෙත් කුඩා පුස්තකාලයකට ආර්ථික සහ ප්‍රායෝගික කරුණු මත පවත්වා ගෙන යාම අපහසු, තවත් සේවාවන් රාශියක් මධ්‍යගත සේවාවන් සේ ප්‍රාදේශීය පුස්තකාල මගින් පවත්වා ගෙන යා හැක. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ හා ප්‍රතිසංස්කරණ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම එක් නිදසුනකි. මේ මගින් පළාතේ පුස්තකාලවල පොත් සහ

අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය කිරීම විද්‍යානුකූලවත්, පුළුල් වශයෙනුත්, ආර්ථික වශයෙන් ලාභදායක ලෙසත් ඉටු කළ හැක. මහනුවර ඩී. එස්. සේනානායක අනුස්මරණ පුස්තකාලයේ පවත්වා ගෙන යන පොත් බැඳීමේ ව්‍යාපෘතිය මෙබඳු වැඩපිළිවෙළක් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බවට හොඳ නිදසුනකි. නව රැකියා අවස්ථා සලසන බැවින් මෙබඳු ව්‍යාපෘතීන් පළාත් සභාවේ විශේෂ ප්‍රසාදයටද හේතුවන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත.

පුස්තකාල දැව භාණ්ඩ (Library furniture) නිෂ්පාදනය මේ අන්දමට මධ්‍යගතව ආරම්භ කළ හැකි තවත් ව්‍යාපෘතියකි. දැනට දිවයිනේ පුස්තකාල හත්දහසකට ආසන්න ප්‍රමාණයක් ඇත ද පුස්තකාල සඳහා සුදුසු ප්‍රමිතීන්ට අනුව දැව භාණ්ඩ නිෂ්පාදනය කිරීම කිසිදු ආයතනයක් තවමත් අත ගසා නොමැති ව්‍යාපෘතියකි. දැව පහසුවෙන් ලබා ගත හැකි පළාතක, ප්‍රාදේශීය පුස්තකාලයක් මෙම ව්‍යාපෘතිය ආරම්භ කළහොත් එය පුස්තකාල ක්ෂෙත්‍රයේ ප්‍රබල වෘත්තීය අවශ්‍යතාවයක් සපුරනවා මෙන්ම ආර්ථික වශයෙන්ද බෙහෙවින් සාර්ථක මූල්‍ය ආයෝජනයක් වනු ඇත.

ජාතික පුස්තකාල සේවාව මධ්‍යම ආණ්ඩුව යටතේ තවදුරටත් පැවතුණද පළාත් සභා යටතේ ඒ ඒ ප්‍රදේශවල පුස්තකාල සේවාව විමධ්‍යගතවීම මේ අන්දමට බෙහෙවින් ඵලදායි ලෙස යොදා ගත හැකි තත්වයකි. ලෝකයේ විමධ්‍යගත හෝ විමධ්‍යගත තත්වයට ආසන්න පාලන ක්‍රම ඇති රටවල් බොහොමයක ඒ ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය පුස්තකාල යටතේ පුස්තකාල සේවාව හොඳින් සංවිධානය වී ඇත. දේශීය පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂෙත්‍රයේ දැනට ඇති ගැටලු ගණනාවක්ම මේ මඟින් විසඳා ගත හැකි බවට සැකයක් නැත.

මෙබඳු විමධ්‍යගත සැලසුම් සහගත පුස්තකාල සේවාවකට අවශ්‍ය පාලන ව්‍යුහය පළාත් සභා ක්‍රමය යටතේ සකස්වී ඇතද පුස්තකාල සේවාව එම ව්‍යුහය තුළ සංවිධානය කිරීම සඳහා සැලකිය යුතු පරිශ්‍රමයක් දැරීමට සිදුවේ. මධ්‍යම ආණ්ඩුව යටතේ ඇති ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයත්, පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධාන වෘත්තීයමය සංවිධානය වන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයත් මෙහිදී සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කළ යුතුව ඇත. එහෙත් වඩාත් වැදගත් සහ තීරණාත්මක කාර්ය භාරය ඒ ඒ පළාත් වල පුස්තකාලවලටත්, පුස්තකාලයාධිපතීන්ටත් හිමි වේ. විශේෂයෙන්ම තම පළාතේ පුස්තකාල නව සැලසුම් යටතේ සංවිධානය කර ගැනීමට ඒ ඒ පළාත්වල පුස්තකාලයාධිපතින් ගේ සංවිධානාත්මක ප්‍රයත්නය මෙහිදී ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළාත් මට්ටමේ සංවිධාන ලෙස හෝ ස්වාධීන සංවිධාන ලෙස පළාත් මට්ටමින් පුස්තකාලයාධිපතීන් වෘත්තීයමය සංවිධාන පිහිටුවා ගැනීම මෙම ක්‍රියාවලියේ මූලික පියවර ලෙස සැලකිය හැක.

මෙම සංවිධානය තම පළාතේ පුස්තකාල සේවාව සංවිධානය කර ගැනීම සඳහා පෙරමුණු කිහිපයකින් ප්‍රයත්න දැරිය යුතුවේ. මූලික වශයෙන්ම මෙම ලිපියේ මුලදී සංක්ෂිප්තව දක්වනු ලැබූ පළාත් මට්ටමින් ඇති කරලීමට අපේක්ෂිත පුස්තකාල සැලැස්ම පිළිබඳ පැහැදිලි අවබෝධයක් පුස්තකාලයාධිපතීන් ලබා ගත යුතුවේ. ඩෙන්මාර්කය, නෝර්වේ, සෝවියට් දේශය, මලයාසියාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය වැනි රටවල් ගණනාවකින් මෙබඳු ප්‍රාදේශීය පුස්තකාල සැලසුම් පිළිබඳ නිදර්ශන ගත හැක. එසේම මෙබඳු පුස්තකාල සැලසුම් පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථ සහ පර්යේෂණ ලිපිත්, විශේෂයෙන්ම යුනෙස්කෝ සහ ඉෆ්ලා (IFLA) සංවිධාන මඟින් නිකුත් කර ඇති ප්‍රකාශනත් හැදෑරීම වැදගත් වේ. පසුගිය දශක කිහිපය තුළ විවිධ මට්ටම් වලින් අප රට තුළ ක්‍රියාත්මක වූ මීට සමාන, සංවිධානාත්මක පුස්තකාල සංවර්ධන වැඩපිළිවෙළවලවල් සහ ඒවායේ දුබලතා විවේචනාත්මකව හැදෑරීම මෙහිදී වඩාත් වැදගත් වනු ඇත. මහනුවර දිස්ත්‍රික් පුස්තකාල නියාමක ව්‍යාපාරය, සියවස පුස්තකාල වැඩ පිළිවෙළ, දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල ව්‍යාපෘතිය, ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය, විවිධ විෂය ක්ෂේත්‍රවලට අයත් පුස්තකාල ජාල සහ ඒවායේ කටයුතු මෙහිදී වැදගත් වන ව්‍යාපෘතිවලින් කිහිපයකි.

මීළඟ පියවර විය යුත්තේ පළාත් සභා ඇමතිවරුනට, මන්ත්‍රීවරුනට සහ පළාතේ ප්‍රධාන නිලධාරීනට මේ පිළිබඳව අවබෝධයක් ලබාදී උනන්දුවක් ඇති කරලීම වේ. අදාල විෂය භාර ඇමතිවරුන් සමග සාකච්ඡා පැවැත්වීම, ප්‍රාදේශීය පුස්තකාල සංගමයේ රැස්වීම් වලට හෝ අදාල විෂය පිළිබඳ විශේෂ සම්මන්ත්‍රණ වලට ආරාධනා කිරීම, පුස්තකාල සැලැස්ම පිළිබඳ පැහැදිලි සහ සරල හැදින්වීම් මෙන්ම විස්තරාත්මක ව්‍යාපෘති පත්‍රිකා සකස් කිරීම වැනි විවිධ ක්‍රම මේ සඳහා යොදා ගත යුතුවේ. පළාතේ පුස්තකාල සංවර්ධනයෙන් සාමාන්‍ය මහජනතාව, පර්යේෂකයින්, පාසල් ශිෂ්‍යයින්, ගුරුවරුන්, පූජ්‍ය පක්ෂය නිලධාරීන් වැනි විවිධ අංශවල අයට යහපතක් සිදුවන නිසා මෙම ව්‍යාපාරයට ඒ කොටස්ද හැකි පමණ ඈඳා ගැනීම වැදගත් වේ. පුස්තකාලයාධිපතීන් පමණක් කරන ඉල්ලීමකට වඩා විවිධ අංශවල විවිධ කොටස් ගණනාවකින් කෙරෙන ඉල්ලීමකට පළාත් සභාවේ වැඩිපුර අවධානය යොමු වනු ඇත.

වඩාත්ම වැදගත් වන කරුණ වනුයේ සැලසුම් සහගත පුස්තකාල සේවාවක් පළාත් සභාවල මූලික අරමුණු සමග කොතෙක් දුරට ගැලපෙන්නේද යන්න හොඳින් පැහැදිලි කිරීම වේ. ඒ ඒ පළාත්වල ආර්ථික, සමාජයීය, අධ්‍යාපනික හා සංස්කෘතික තත්වයන් සංවර්ධනය කරලීමත් පළාතේ කටයුතු පිළිබඳ පළාතේ ජනතාවට සහභාගිවීමට අවස්ථාවක් සැලසීමත් මෙබඳු විමධ්‍යගත පාලනවල මූලික අරමුණ වේ. මෙම අරමුණ සාර්ථක ලෙස ඉටු කර ගැනීමට යහපත් පුස්තකාල හා විඥාපන සේවාවක වැදගත්කම නිරතුරුවම අවධාරණය කළ යුතු වේ. කෘෂිකර්මාන්තයේ නියැලුණු ගොවීන්ට නව බීජ වර්ග, නවීන ගොවිතැන් ක්‍රම, පොහොර භාවිතය,

යන්ත්‍ර සූත්‍ර භාවිතය, වැනි විවිධ අංශ පිළිබඳ නිරන්තර විද්‍යාත්මක දැනුම පුස්තකාල සේවා මගින් ලබා දිය හැකි අයුරුත්, කුඩා පරිමාණයේ කාර්මිකයන්ට තම ව්‍යවසායකයේ දියුණුවට අවශ්‍ය විවිධ තොරතුරු ලබා ගැනීමට යහපත් පුස්තකාල සේවාවක් උපකාරවන අන්දමත්, සාර්ථක පුස්තකාල සේවාවක් නොමැති පාසල් අධ්‍යාපනයේ නිරර්ථක බවත්, අවශ්‍ය තොරතුරු නොමැතිව නිලධාරීන් සකස් කරන සැලසුම් වල අසාර්ථක බවත්, පළාතේ විවිධ අංශ පිළිබඳ පර්යේෂණ කරන උගතුන්ට පුස්තකාල සේවාවක් අත්‍යවශ්‍ය වන ආකාරයත් සරලව පැහැදිලි කළ යුතුවේ. පුස්තකාල සේවාව දුර්වල වීමෙන් පළාතේ උසස් අධ්‍යාපන කටයුතු අඩාල වන අන්දමත්, තරුණ පෙළට තම විවේක කාලය අර්ථවත්ව ගත කළ හැකි මාර්ගයන් වැසී යන ආකාරයත්, ඒ අනුව උගතුන්, බුද්ධිමතුන්, නිලධාරීන්, ශිෂ්‍යයින් වැනි නව දැනුම පිපාසයෙන් පෙළෙන අය පුස්තකාල පහසුකම් සොයා රටේ අගනුවරට හෝ වෙනත් පළාත්වලට ඇදී යා හැකි අන්දමත් පැහැදිලි කළ යුතු වේ. සෑම ක්ෂේත්‍රයකට ම අවශ්‍ය නව දැනුම නිරන්තරව සැපයෙන සැලසුම් සහගත වැඩපිළිවෙළකින් තොරව සිදුවන සංවර්ධන ප්‍රයත්නයන් නූතන ලෝකයේ නිරර්ථක වන ආකාරයත් නව දැනුම සෙවීමට සහ නව දැනුම බෙදා ගැනීමට කෙරෙන විශාල අරගලයත්, මෙම ප්‍රවාහයට සම්බන්ධ නොවී සිටීමට නොහැකි බවත් දැක්විය යුතුය. මේ අනුව පුස්තකාල සේවාව මේතාක් සැලකූ අන්දමේ 'අවශ්‍ය නම් ඉටු කළ හැකි' සේවාවක් නොව 'අත්‍යවශ්‍යයෙන්ම ඉටු කළ යුතු' සේවාවක් බව පැහැදිලි කළ යුතුවේ.

එසේම පුස්තකාල සේවාව "අවශ්‍යයෙන්ම මුදල් වැයවන සේවාවක් පමණක්"ය යන සංකල්පයටද එරෙහි විය යුතුවේ. පුස්තකාල සේවාව තව දුරටත් නොමිලයේ සැපයෙන සේවාවක් වුවද එහි ආදායම් උපයන මාර්ග සැලකිය යුතු ප්‍රමාණයක් ඇති බව අමතක නොකළ යුතුය. ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලය මගින් පවත්වා ගෙන යනු ලබන විවිධ මධ්‍යගත සේවා නොමිලයේ ඉටු කිරීමක් අපේක්ෂා නොකෙරේ. මධ්‍යගත ප්‍රතිග්‍රහණය, තාක්ෂණික සේවා, මධ්‍යගත සූචිකරණය, විශේෂ තොරතුරු සැපයීමේ සේවා, ප්‍රලේඛන සේවා, සංරක්ෂණ හා ප්‍රතිසංස්කරණ කාර්‍ය ආදිය සඳහා අය කිරීමක් කළ යුතු වේ. සියලුම පුස්තකාල තම අන්තර් පුස්තකාල පිරුළු සේවා, විශේෂ තොරතුරු සැපයීමේ සේවා, ප්‍රතිරූපන සේවා, ඡායා පිටපත් සේවා ආදිය සඳහා අයකිරීමක් කිරීම සාධාරණය. පුස්තකාල ද්‍රව භාණ්ඩ, උපකරණ වැනි දෑ නිෂ්පාදනය ලාභදායි ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යාහැකි අංශයකි. මේ අන්දමට ප්‍රධාන පුස්තකාල සේවාව නොමිලයේ සැපයූනද එහි ආදායම් ඉපයිය හැකි විශේෂ අංශ ප්‍රසාරණය කිරීමටත්, ඒ අංශ මගින් ලැබෙන ආදායම් වලින් අනික් අංශවල වියදම සම්පූර්ණයෙන් හෝ සැලකිය යුතු ප්‍රමාණයකට පියවා ගැනීම අපහසු නොවන බවත් පැහැදිලි කිරීම අවශ්‍ය වේ. බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ අන්තර් පුස්තකාල පිරුළු සේවා අංශයෙන් ලැබෙන ආදායම නිසා මුළු ජාතික පුස්තකාල සේවාවම ආර්ථික වශයෙන් රජයට බරක් නොවන අන්දමට පවත්වා ගෙන යා හැකිවී ඇත. ඩෙන්මාර්කයේ පුස්තකාල කාර්යාංශය, පුස්තකාල ද්‍රව භාණ්ඩ නිෂ්පාදනය, මධ්‍යගත මිලදී ගැනීම්, තාක්ෂණික සේවා සහ මධ්‍යගත සූචි පත්‍රිකා සේවා මගින් වාර්ෂිකව විශාල ආදායම් උපදවන ආයතනයක් වී ඇත.

එසේම යහපත් පුස්තකාල සේවාවක් පළාතේ රැකියා ප්‍රශ්නයට ඉතා හොඳ විසඳුමක් වේ. ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලය, දිස්ත්‍රික් පුස්තකාල, විවිධ ක්ෂේත්‍රවල පුස්තකාල මනාව සංවිධානය කිරීමෙන් ඒ ඒ පළාත්වල නව රැකියා අවස්ථා සිය ගණනක් ඇතැම් විට දහස් ගණනක් ඇතිවේ. පුස්තකාල ක්ෂේත්‍රයේ මෙන්ම විවිධ අදාල තාක්ෂණික ක්ෂේත්‍ර රැකියා අවස්ථාවන් මෙහිදී සලකා බලා ඇත. මීට අමතරව යහපත් පුස්තකාල සේවාවක් මගින් ස්වයං රැකියා ව්‍යාපෘතීන්ට ලැබෙන අනුග්‍රහය ඉතා විශාල වේ. නිවැරදි විද්‍යාත්මක තොරතුරු සැපයේ නම්, සුළු මග පෙන්වීමකින් ඇරඹිය හැකි ස්වයං රැකියා ව්‍යාපෘතීන් සිය ගණනක් ඇත. එසේම අලුත් විද්‍යාත්මක තොරතුරු සැපයීම මගින් ඒ ඒ පළාත්වල දැනට ඇති විවිධ කර්මාන්ත ව්‍යාපෘතීන් ප්‍රතිසංවිධානය කරලීමටත් ඒ මගින් රැකියා අවස්ථා වැඩිකරලීමටත්, අවස්ථාව සැලසේ. දැනට දිවයිනේ විසිරී ඇති විවිධ සුළු හා ගෘහස්ථ කර්මාන්තවල තත්වය, නවීන තාක්ෂණය හා නිෂ්පාදන විධි පිළිබඳ සුළු හඳුන්වාදීමකින් විශාල වශයෙන් උසස් කළ හැකි බව සොයා ගෙන ඇත. මෙම අලුත් තොරතුරු ගම්බදව ගෙන යාමට පුස්තකාලයට වඩා හොඳ ප්‍රවාහකයෙක් නොමැත.

ප්‍රාදේශීය වශයෙන් පුස්තකාල සේවාව විධිමත්ව සැලසුම් කිරීමට අදාල, මූලික පුස්තකාල ව්‍යවස්ථාවන් පළාත් සභාව විසින් සම්පාදනය කිරීම අවශ්‍ය වේ. ඒ මගින් පළාතේ පුස්තකාල කටයුතු පිළිබඳ අධිකාරියක් සහ ප්‍රාදේශීය පුස්තකාලයක් ව්‍යවස්ථානුකූලව පිහිටුවිය යුතුවේ. පළාතේ හොඳ පුස්තකාල සේවාවක් සැලසුම් කිරීමට අවශ්‍ය බලතල මෙන්ම අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනය මේ අනුව මෙම අධිකාරියට හිමි විය යුතුවේ. ප්‍රාදේශීය පුස්තකාල අධිකාරියට සහ ප්‍රාදේශීය පුස්තකාලයට තම කටයුතු කර ගෙන යාමට අවශ්‍ය බලතල සහ මූල්‍ය ප්‍රතිපාදන බාධාවකින් තොරව සැලසීම ප්‍රාදේශීය පුස්තකාල සේවාවක සාර්ථකත්වයේ මුල් පදනම වේ. කොළඹ හා යාපනය වැනි නගරවල පැවති උසස් පුස්තකාල පහසුකම් නිසා එම ප්‍රදේශ අධ්‍යාපනික අතින් දිවයිනේ අනිත් ප්‍රදේශ වලට වඩා ඉදිරියට ගිය ආකාරය කවුරුත් දන්නා කරුණකි. නව වසර කිහිපයකින් පළාත් අතර සංවර්ධන පරතරයද ඒවායේ සැලසෙන පුස්තකාල පහසුකම් වලින් තීරණය වීමට බොහෝ දුරට ඉඩ ඇත.

## References


1. Amarasiri, M. S. U. 'SLNLSB and Public Library Service in Sri Lanka' in 'Library News' Vol. 8, No. 3, 1987, pp 6—12.

2. Kamaldeen, S. M. 'Proposed District Library system for Sri Lanka' paper presented at the District Library Seminar, organised by SLNLSB, 1981.

3. Leitan, G. R. Tressie 'Sri Lanka's proposals for devolution and decentralisation-financial implications of the system of provincial councils' Seminar on financial relations........'; Colombo Marga Institute, Dec. 1987,

4. Public Library Legislation Advisory Committee Report-Sri Lanka National Library Services Board, Colombo, 1987.

# මහජන පුස්තකාලය කවරෙකුගේ නිර්මාණයක්ද?

ඩී. ජී. එස්. දෙඩංවත්ත

පුස්තකාලයාධිපති,

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය,

කොළඹ 10.

මහජන පුස්තකාල සේවය තුළ අධ්‍යාපනික නිපුණතාව හා ශිල්පීය දැනුම කැපකර සිටින සෑම සේවා නියුක්තිකයකුම මහජන පුස්තකාල ඉතිහාසයට අන්තර්ග්‍රහණය වූ ස්වීය ලක්ෂණ පිළිබඳව අවබෝධයක් ඇතිව සිටීම ඉතා ප්‍රයෝජනවත් ය. මහජන පුස්තකාලය වර්තමාන ජන ජීවිතයට සමීපවූ ද අත්‍යාවශ්‍යවූ ද අංගයක් බවට පත්වී තිබේ. ප්‍රදේශ වශයෙන් ඒකරාශිවූ සමාජ සමූහයකට එක් පියස්සක් යට සිට කියවීම, ලිවීම, කල්පනා කිරීම, තීරණ ගැනීම, නිර්මාණය කිරීම, සන්තෝෂය හා දැනුම ලබා ගැනීම සඳහා අතීතයේ සිටම මහජන පුස්තකාලය කේන්ද්‍රස්ථානය විය. අන් කවර ආයතනයකටත් වඩා අතීතයේ පටන් අත්පත් කර ගනු ලැබූ ස්වාධීනවූත් ප්‍රජාතාන්ත්‍රික වූත් ලක්ෂණ රැසක් මහජන පුස්තකාල සංකල්ප තුළ සංකලනය වී ඇත.

මහජන පුස්තකාල ඉතිහාසයේ අතීතයට නෙත් යොමු කිරීමේදී ඉහත දක්වන ලද කරුණු හොඳින් සනාථ කරයි. පන්සල් හා දේවස්ථාන පුස්තකාල උරුමය හැදෑරීමේ දී එය හුදෙක්ම ආගමික අධ්‍යාපන අවශ්‍යතාවන්ට නැඹුරු වූවක් බව පෙනෙයි. කිසියම් සමයාන්තර දර්ශනයක් හා ධර්මයක් හා බැඳුණු එම පුස්තකාල, පුද්ගලයාට ධර්මය වන පොත් කිරීමට හෝ ධර්මය ගැඹුරින් හැදෑරීමට හෝ පමණක් උදව් උපකාරී විය. ආගම ධර්මය ලේඛන ගත කිරීම, එම ලේඛන සුරක්ෂිතව තැන්පත් කිරීම හා ප්‍රවේසම් සහිතව පරිභෝජනයට ගැනීම, ශත වර්ෂ ගණනාවක් තිස්සේ මේ ආරාම පුස්තකාලවල කාර්ය භාරය විය.

නවීන විද්‍යා සංකල්ප අන්තර්ග්‍රහණය කරමින් උසස් අධ්‍යාපනය වර්ධනය වෙත්ම ආගමික ස්ථානවල රෝපණය වූ පුස්තකාල ක්ෂෙත්‍රයෙන් කොටසක් කැඩී ගොස් අධ්‍යාපනික ආයතන හා සම්බන්ධ විය. දහසය වෙනි ශතවර්ෂයෙන් පසුව බිහිවූ මුද්‍රණ ශිල්පයේ සහ කඩදාසි නිපදවීමේ කාර්මික විද්‍යා ඥාණයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහිවන්නට පටන් ගත් පොත්පත් සුලභතාවය හේතු කොට ගෙන ආරාම හා අධ්‍යාපනික ආයතන යන දෙවර්ගයටම සම්බන්ධ නොවී ස්වාධීනත්වය අගයන ස්ථානයක සිට දැනුම සෙවීම, දර්ශණ සම්ප්‍රදායයන් විචාරයට ලක් කිරීම, සාහිත්‍ය කලා විනෝදාශ්වාදය ලැබීමට සමාජයට අවශ්‍ය විය. සාමාන්‍ය අධ්‍යාපනයෙන් ඉවත් වී සිටි එමෙන්ම ආගමික කොටු පවුරු තුළ සිරවීමට අකමැති වූ ස්වාධීන සමාජ කණ්ඩායම් ඒකරාශි වීමේ ප්‍රතිඵලයකි, මහජන පුස්තකාල සේවයේ ආරම්භය. මේ සමාජ කණ්ඩායම්වල ප්‍රජාතාන්ත්‍රික චින්තන අරගලය නොනැවතී ගලා ගිය අතර, මහජන පුස්තකාල සේවයේ ස්ථාවරයට හා ව්‍යාප්තියට එයම හේතු විය.

මහජන පුස්තකාල විශේෂය ඇතිවීමට පදනම් වූ චින්තන රටාවේ ප්‍රජාතාන්ත්‍රික දර්ශනික ලක්ෂණ මේ දක්වා නොවෙනස්ව නොනැසී පවතී. මේ යුගයේ කෙබඳු රටක වුව ද සංවිධාන කරනු ලබන මහජන පුස්තකාලයක ප්‍රජාතාන්ත්‍රික පැවැතුම් සුලභව දක්නට ඇත. වර්තමාන යුගයේ මහජන පුස්තකාල සේවය සඳහා කැපවූවන්ගේ අරමුණ පාඨක ජනතාවට වඩා හොඳ සේවයක් සැලසීම නම්, ඔවුන් මේ ප්‍රජාතාන්ත්‍රික චින්තන රටාව මනාව තේරුම් ගෙන සිටිය යුතුය.

ආරම්භයේ දී නිදහස් විද්වතුන්ගේ ඒකරාශි වීමෙන් මහජන පුස්තකාල බිහි වූ බව මුලින් අනාවරණය විය. මේ විද්වත්හු කුඩා ප්‍රබුද්ධ කණ්ඩායම් වශයෙන් එක් වී කුඩා සමිති සමාගම් පිහිටුවා ගෙන මහජන පුස්තකාල නඩත්තු කළහ. එහෙත් කල්යාමේදී එම සමිති සමාගම් විවිධ මූල්‍ය අර්බුදවලට මුහුණ පෑම නිසා පුස්තකාල නඩත්තුව අසීරු කරුණක් බවට පත් විය. රාජ්‍ය ආයතනයකටම මිස වෙනත් ආයතනයකට මෙහි බර දැරීම දුෂ්කර විය.

තවදුරටත් මහජන පුස්තකාල පවත්වා ගෙන යාමට නොහැකි වන තරමට මූල්‍ය හා පරිපාලන දුෂ්කරතා වර්ධනය වූයෙන් රාජ්‍ය අංශයේ සැලකිල්ල මේ සඳහා යොමු විණ. ජන අධ්‍යාපනයේ උසස් තැනක් මහජන පුස්තකාලය හිමිකරගෙන තිබිණ. මහජන පුස්තකාල බිඳ වැටීම යනු ජන අධ්‍යාපනයට ලැබෙන අභියෝගයකි. අනික් අතට රාජ්‍ය අංශයේ බලපෑම් ඇති කිරීමටද කදිම අවස්ථාවක් විය. ඒ මන්ද යත්, විද්වතුන් පිරිසකට පමණක් සීමා වී ඇති මහජන පුස්තකාලයේ දොරටු සාමාන්‍ය ජනතාවටත් විවර කර දීමට ඇති හැකියාවයි. සාමාන්‍ය ජනතාවද නොඉවසිල්ලෙන් බලා සිටින්නේ රාජ්‍ය අංශයේ සහයෝගයෙන් තමන් ද මහජන පුස්තකාලයේ කොටස්කරුවන් වීමට ය. මේ සෑම කරුණකම ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ දී මහජන පුස්තකාලයේ පාලනය රාජ්‍ය ආයතනයකට පැවරිණ.

රජයේ පාලනයට නතු වීමෙන් පසු මහජන පුස්තකාල සේවයේ සීඝ්‍ර සංවර්ධනයක් ඇති විය. ජනතාව වඩ වඩාත් පුස්තකාලය සඳහා ඇදී ඒමක් ද ජනතා අවශ්‍යතාව මත ව්‍යවස්ථා සම්පාදනයක් ද ඇති විය. මේ ව්‍යවස්ථා සම්පාදනයෙහිලා ප්‍රජා අරමුණු පහත සඳහන් පරිදි අන්තර්ගත විය.

1. මහජන පුස්තකාලය, ප්‍රදේශයේ පළාත් පාලන බල මණ්ඩලය මගින් පාලනය විය යුතු, සංවිධාන කළ යුතු, සංවර්ධනය කළ යුතු, පොදු ජන ආයතනයකි. එහි අරමුණු ඉතා වැදගත් ය. පළාත් පාලන අමාත්‍යාංශයට හෝ එහි උපදෙස් ඇතිව පළාත් පාලන බල මණ්ඩලයට පමණක් පුස්තකාල නීතිරීති රෙගුලාසි පැනවීමේ බලය හිමි විය යුතුය.

2. ජාති, කුල, ආගම්, පන්ති, ධන නිර්ධන ආදී බෙදීම්වල බාධක වලින් තොරව ප්‍රදේශයේ කවර කෙනෙකුට වුව ද පුස්තකාලය පරිහරණය කිරීමේ අයිතිවාසිකම් හිමිවිය යුතුය.

3. බාල, තරුණ, වැඩිහිටි, මහලු ආදී කවර වයස් සීමාවක කෙනෙකුට වුව ද පුස්තකාලයේ ස්ථානයක් හිමිවිය යුතුය.

4. අඳ, ගොළු, බිහිරි වශයෙන් ආබාධිත වූ කිසිවෙකුට එම කරුණ පුස්තකාල සම්පත් පරිභෝජනයේ දී බාධාවක් නොවිය යුතුයි. මෙවැනි පාඨකයින්ට සුදුසු පුස්තකාල සම්පත් හා පහසුකම් ලබා දිය යුතුයි.

5. උගත්, නූගත් රැකියාවේ උස් පහත් බව මහජන පුස්තකාලය ප්‍රයෝජනයට ගැනීමට කිසිවෙකුට බාධාවක් නොවිය යුතුයි.

6. කියවීමට හා හැදෑරීමට කැමැති එහෙත් පුස්තකාලයට පැමිණීමට ඉඩකඩ නැති ප්‍රජාව ළඟට ගොස් පුස්තකාල පහසුකම් සැපයීම් කළ යුතුයි.

7. පුස්තකාලයට පැමිණීමට කිසිදු උනන්දුවක් නැත්තවුන් සොයාගෙන ගොස් ඔවුන් පොත පතට පෙළඹවීමේ උපක්‍රම ක්‍රියාත්මක කළ යුතුයි.

8. බල ප්‍රදේශයෙන් පිටස්තර පදිංචි කරුවෙක් වුවද බල ප්‍රදේශය තුළ රැකියාවක, ව්‍යාපාරයක, අධ්‍යාපනයෙහි හෝ වෙනත් කාර්යයක යෙදී සිටින්නේ නම්, ඔහු හෝ ඇය ද පුස්තකාල පහසුකම් ඉල්ලා සිටින්නේ නම් එය ඉටු කළ යුතුය.

9. සමාජයේ අනාරක්ෂකර බව තුරන් කිරීමට මහජන පුස්තකාලය කැප විය යුතුය.

10. පර්යේෂණ හෝ ස්වඅධ්‍යාපනයෙහි යෙදෙන කවරකුට හෝ පූර්ණ පුස්තකාල පහසුකම් සැපයීම් කළ යුතුයි.

ඉහත දක්වන ලද මහජන පුස්තකාල අරමුණු එකවරම ව්‍යවස්ථා ගත වූවක් නොවේ. මුල් යුගයේදී වැඩිහිටියන්ගේ අරමුණු සපුරා ලීමට ව්‍යවස්ථා සම්පාදනය විය. ළමයින්, යෞවනයන්, ආබාධිතයන්, ගෘහණියන් හා වෙනත් විවිධ තරාතිරම් වල හා කාර්යයන්හි නියුක්ත වූවන් හා සමාජමය චින්තන විප්ලවයකට තුඩු දෙන අරමුණු ව්‍යවස්ථාවන්ට අන්තර්ගත වූයේ ඉතා මෑතකදී ය. අද සංස්කෘතික හා ජන අධ්‍යාපනයෙහි කාර්යභාරයක් මහජන පුස්තකාල අරමුණු වී ඇත.

මහජන පුස්තකාල අරමුණුවල ව්‍යාප්තිය ගැන හොඳින් නිරීක්ෂණය කරන විට පෙනී යන්නේ එය කලින් කලට කිසිවකු විසින් පවරන ලද නීතිරීති සමුදායයක් නොව, සමාජයේ සෑම ජනකොට්ඨාශයක්ම මහජන පුස්තකාලයේ ඥාන සම්භාරයට හිමිකම් පෑමට ගත් උත්සාහයයි. මේ කරුණු පදනම් කරගත් විට සැබැවින්ම මහජන පුස්තකාලය කාගේ නිර්මාණයක් ද'යි විමසීමට අපට අවශ්‍ය තොරතුරු ලබා ගත හැක.

**'අපේක්ෂා, පරමාර්ථ සහ දෘෂ්ටීන් සහිත ක්‍රියාශීලී පරිසරයක මහජන පුස්තකාලය ක්‍රියාත්මක වේ. එමගින් දෙනු ලබන සේවය, උසස් ලෙස සහ සියුම් මාර්ගවලින් පවා වෙනස් කළ හැකි පුද්ගලයන්ගෙන් සමන්විතව පාලනය වන සමාජ ආයතනයකි, මහජන පුස්තකාලය.'**

**බ්‍රයන් ලක්නම්** නමැති අධ්‍යාපනඥයාගේ ඉහත සඳහන් ප්‍රකාශයෙන් පෙනී යන්නේ මහජන පුස්තකාලය කිසියම් ක්‍රියාශීලී පරිසරයක ක්‍රියාත්මක වන සමාජ අවශ්‍යතාවන්ට අනුරූපව වෙනස්වන ආයතනයක් බවය.

**'මහජන පුස්තකාල හැඩ ගැසෙන්නේ පුස්තකාලයාධිපතිවරුන් අතින් නොව සමාජය අතිනි!'යි** ලක්නම් මේ අදහස ඉතා සරල ලෙස කෙටි නිර්වචනයකින් දක්වයි.

ලක්නම් ගේ අදහස් තර්කානුකූලය. මහජන පුස්තකාලය හැඩ ගැසෙන්නේ සමාජය අතින් නම් පුස්තකාලයාධිපතිවරුන්ගේ හා කාර්ය මණ්ඩල සතු කාර්ය භාරය හා කැපවීම කුමක්ද? ඔහු ඊට ද තර්කානුකූලව පිළිතුරු දෙයි.

**'මහජන පුස්තකාලයේ දර්ශනය, අරමුණු හා කාර්ය භාරය ආපස්සට බැලීමෙන් පමණක් ඉතිහාසඥයාට ගෙවී ගිය කාලයේ ප්‍රවෘත්තිය අනුව, ඉටුවී ඇති කාර්යභාරය තක්සේරු කර ගත හැක. වෘත්තීය වශයෙන් පුස්තකාලයාධිපතිවරුන් අතර මෙල්විල් ඩිවි සහ පැනිට්සි, ශූන්‍යතාවයෙන් (Vacuum) යුතුව ක්‍රියා නොකළ බව හැමවිටම මතක තබා ගත යුතුයි. ඔවුන් ශ්‍රේෂ්ඨ පුස්තකාලයාධිපතිවරුන් වූයේ තමන්ගේ සමාජ**

**කාර්යය වටහා ගැනීම නිසා'යයි ඇත්ත වශයෙන්ම තර්ක කළ හැක.'**

**— පුස්තකාල බලය**
**(ජේම්ස් තොම්සන්)**

මෙහිදී අප ඉදිරියෙහි ඉතා වැදගත් කරුණු දෙකක් අනාවරණය වේ.

1. මහජන පුස්තකාලය, සමාජය විසින් කරනු ලබන නිර්මාණයකි. විවිධ නව අපේක්ෂා අරමුණු ඇතුළු කරමින් එය හැඩ ගසනු ලබන්නේ ද සමාජය විසිනි.

2. සමාජය අපේක්ෂිත අරමුණු තේරුම් ගෙන විවිධ මාර්ග වලින් සියුම් ලෙස හා ප්‍රබලව එම අරමුණු ඉටු කර දිය යුත්තේ මහජන පුස්තකාලයාධිපතිවරයා විසිනි.

මේ දෙවැදෑරුම් කරුණ හොඳින් තේරුම් ගෙන සිටීම සෑම මහජන පුස්තකාල සේවා නියුක්තිකයෙකුටම ප්‍රයෝජනවත් ය.

විවිධ විද්‍යා ශාස්ත්‍ර ප්‍රගුණ කළ භාෂා ප්‍රවීණතා ඇති උගතුන්ගේ සාමූහික අවශ්‍යතාව සඳහා මහජන පුස්තකාලය බිහිවූ තැන් පටන් අද ඉලෙක්ට්‍රොනික් යුගයේ ආරම්භය දක්වා මහජන පුස්තකාල ක්‍ෂෙත්‍රයෙහි ඇති වූ වෙනස්කම් බොහෝය. මේ වෙනස්කම් සියල්ලම පාහේ පොදු ජන අවශ්‍යතාව අනුව සිදුවී ඇත. මහජන පුස්තකාලය සමාජයේම පොදු අවශ්‍යතාවක් බවට පත්වී ඇත. සමාජයේ සෑම ජන කොට්ඨාශයක්ම මහජන පුස්තකාලයට හිමිකම් පාන අයුරු අද අපට මනාව තේරුම් ගත හැක. අද ජන අපේක්ෂාවන් කොයිතරම් ඉදිරියට ගොස් ඇත්ද'යි අපට මෙහි පහත සඳහන් කියුමෙන් ඔප්පු වේ.

**'රටේ අධ්‍යාපනය, තොරතුරු අවශ්‍යතා, සංස්කෘතික සහ විනෝදාත්මක අවශ්‍යතා සපුරාලන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන බැවින් මහජන පුස්තකාල ජාතියට ඉමහත් සේවාවක් ඉටු කරන ආයතනයන් ය. මහජන පුස්තකාලය කෙනෙකුට වෙනත් අයෙකුගේ මැදහත් වීමක් නොමැතිව නිදහසේ ඉගෙන ගැනීමට අවස්ථාව සලසන ආයතනයකි. ජාතියක දියුණුව සඳහා සංස්කෘතිය සහ අධ්‍යාපනය අවශ්‍ය වූවකි. මේ අවශ්‍යතාවය බොහෝ දුරට මහජන පුස්තකාලය සපුරාලයි.'**

**– ඊශ්වරී කොරයා – දියමන්ති උලෙල සමරු ප්‍රකාශණය 1925–85 (59 පිට)**

වර්තමානයේ මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ ඇති වී ඇති තවත් පරිවර්තනයක් දක්නට ලැබේ. එනම් අතීතයේ මහජන පුස්තකාලය ආරම්භ කළ වැඩිහිටි ප්‍රවීණයන්ගේ ස්ථානය වර්තමාන තරුණ පෙළ විසින් අත්පත් කරගෙන ඇති සැටියි. එදා ප්‍රධාන පාඨක පිරිස ලෙස ඉදිරියෙන් සිටි වැඩිහිටි උගතුන් පිරිස අද දෙවැනි ස්ථානයට පැමිණ ඇත. මෙවැනි සමාජ වෙනස්වීම් සෑම මහජන පුස්තකාල සේවා නියුක්තිකයකුම තේරුම් ගෙන සිටිය යුතුයි.

මහජන පුස්තකාලයාධිපතිවරයා නීති රීති සමුදයයක් සුරකින විනයාචාර්යවරයෙකු නොව ජනතා අපේක්ෂා සහ අරමුණු තේරුම් ගත් ඒ අරමුණු හා අපේක්ෂා සපුරා ලීමට විවිධ මං සොයන නිර්මාණාත්මක හැඟීම් ඇති පුද්ගලයෙකු විය යුතු ය. ඔහු ජන හද ගැහෙන රාවය අසා සිටිය යුතුය. හැම ගැටලුවකටම වඩාත් නිවැරදි පිළිතුර ඔහු සතුව තිබිය යුතුය.

පලාත් පාලන බල මණ්ඩල අධිකාරීන්ගේ හා පුස්තකාලයාධිපතිවරුන්ගේ ගබඩාකරණයට ඇති නැඹුරුව, පුස්තකාලය හා ජනතාව අතර ඇති සමීපතාවයට හානි කරන අවස්ථා එමටය. ශ්‍රී ලංකාව වැනි තුන්වෙනි ලෝකයේ බොහෝ රටවල ගබඩා කළමණාකරණයේ ලක්ෂණ පුස්තකාල කළමණාකරණයට ඉතා අයහපත් ලෙස බලපා ඇත. ජනතා උරුමයෙන්, මහජන පුස්තකාලය උදුරා හුදකලා ස්ථානයක දොරගුළු දැමූ ගබඩාවක් බවට පත්කිරීමට අධිකාරීන්ගේ ගබඩා පාලන ක්‍රමයට හැකිවී තිබේ. මේ තත්ත්වයෙන් පුස්තකාලය මුදවා ගෙන එය ජනතා උරුමය තුළ රැඳවීම බල අධිකාරීන්ගේ මෙන් ම පුස්තකාලයාධිපතිවරුන්ගේ ද අරමුණ විය යුතුයි.

එහෙත් සැබෑ මහජන පුස්තකාලය, ජනතාව සතු සැබෑ උරුමයකි. සැබවින්ම ජනතාව පිළිගත් මහජන පුස්තකාලය ජනතාව විසින් ම නිර්මාණය කරනු ලැබූවකි. එය හැඩ වැඩ කරනු ලබන්නේ ද ජනතාව විසිනි.

## නව නිලධාරීන්

ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමයට 1988 වසර සඳහා පහත සඳහන් නිලධාරී මණ්ඩලය පත් වී ඇත.

**සභාපති:–** දයාවංශ ජයකොඩි මහතා

**උප සභාපති:–** එස්. ගොඩගේ මහතා
ගුණසේන විතාන මහතා
මහින්ද රූලපනාව මහතා

**ප්‍රධාන ලේකම්:–** හෙන්රි සමරනායක මහතා

**උප ලේකම්:–** අනුර සී. පෙරේරා මහතා
කරුණාරත්න සපුතන්ත්‍රි මහතා

**භාණ්ඩාගාරික:–** ආරියදාස වීරමන් මහතා

**කාරක සභිකවරු:–** කේ. වී. ඒ. ජයවර්ධන මහතා, සෝමපාල ජයවර්ධන මහතා, සෝමසිරි කස්තුරිආරච්චි මහතා, ආරියපාල ඉඹුල්දෙනිය මහතා, ඩබ්ලිව්. ඕ. වී. ප්‍රනාන්දු මහතා, කේ. ජයතිලක මහතා, නිමල් ආරියවංශ පෙරේරා මහතා, සුනිල් අහන්ගංගොඩ මහතා, පියසේන වික්‍රමගේ මහතා.

**ප්‍රචාරක කටයුතු භාර නිලධාරී:–**
සෝමසිරි කස්තුරිආරච්චි මහතා

# පුවත් ලුහුඬින්

## දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණය දෙවන අදියර

දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණය යටතේ ගම්පහ, කළුතර, මාතලේ, කෑගල්ල දිස්ත්‍රික්ක වල ඇති සියළුම පුස්තකාල පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වැඩ පිළිවෙලක් සැලසුම් කර ඇත. මෙම තොරතුරු සැපයීම සඳහා පහත සඳහන් මහත්ම මහත්මියන් පත් කර ඇත.

1. **මාතලේ දිස්ත්‍රික්කය – මහනුවර මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති බී. රත්නායක**
2. **කළුතර දිස්ත්‍රික්කය – කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ පුස්තකාලයාධිපති එල්. ආර්. අමරකෝන්.**
3. **ගම්පහ දිස්ත්‍රික්කය – කැලණිය විශ්ව විද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති පී. රණසිංහ**
4. **කෑගල්ල දිස්ත්‍රික්කය-රත්මලාන කාර්මික විද්‍යාලයේ පුස්තකාලයාධිපති ඩබ්ලිව්. එස්. පුණ්‍යවර්ධන**

## ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පාඨමාලා

ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පාඨමාලා දෙකක් අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ සහාය ඇතිව ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් මේ වසරේ දෙවෙනි කාර්තුව තුලදී පවත්වන ලදී. බණ්ඩාරවෙල අධ්‍යාපන කොට්ඨාශයේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණය මැයි 23 සිට 26 දක්වා හාලිඇල විද්‍යා ආධාරක මධ්‍යස්ථානයේ දී ද, මහනුවර අධ්‍යාපන කොට්ඨාශයේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණය ජූනි 6 සිට 19 දක්වා මහනුවර ධර්මරාජ ප්‍රාථමික විද්‍යාලයේ දී ද පවත්වන ලදී. මේ පාඨමාලා දෙක සඳහා ගුරු පුස්තකාලයාධිපතීන් 140 දෙනෙක් සහභාගී වූහ.

## අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය

වාණිජ මට්ටමේ ප්‍රකාශකයින්, රජයේ සහ රජයේ නොවන ප්‍රකාශකයින් සහ කතෘ ප්‍රකශකයින් ග්‍රන්ථනාම එකසිය අසූ එකක් සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටි අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක කාර්යාංශයෙන් මේ වසරේ දෙවෙනි කාර්තුවේ අංක ලබා ගෙන ඇත.

## පොත් ප්‍රදර්ශන

මෙම වසරේ දෙවන කාර්තුව තුලදී දිවයින පුරා පොත් ප්‍රදර්ශන ගණනාවක් පුස්තකාල සේවා මණ්ඩලය විසින් පවත්වන ලදී. දෙල්ගොඩ මහජන පුස්තකාලය, කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය ආදී ශිෂ්‍ය සංගමය සංවිධානය කළ මහපොළ උත්සවය, කොළඹ නාලන්ද විද්‍යාලය, පොත් ප්‍රදර්ශන පවත්වන ලද ස්ථාන වලින් කිහිපයකි.

## කතෘ ප්‍රකාශක ආධාර වැඩ පිළිවෙළ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන කතෘ ප්‍රකාශක ආධාර වැඩ පිළිවෙළ යටතේ මෙම වසරේ දෙවන කාර්තුව තුලදී ග්‍රන්ථනාම 60 ක් යටතේ ප්‍රකාශයට පත් වූ පොත් සඳහා ආධාර ලබා දී ඇත.

## පොත් පරිත්‍යාග

1988 අප්‍රේල් / ජූනි කාලය තුලදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් රු: 1,41,603.25 ක් වටිනා පොත් 6012 පාසල්, මහජන, ආයතනික පුස්තකාල 27 කට පරිත්‍යාග කර ඇත.

## පාඨමාලාවකට එතෙර

තොරතුරු තාක්ෂණය හා පුස්තකාල පරිගණක සේවාවන් පිළිබඳ පාඨමාලාවක් මේ දිනවල බැංකොක් නුවර තාක්ෂණය පිළිබඳ ආසියාතික ආයතනයේ පුස්තකාල හා ප්‍රාදේශික ප්‍රලේඛන මධ්‍යස්ථානයේ දී පැවැත්වේ. ශ්‍රී ලංකා ව්‍යාපාරික සංවර්ධන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ගයත්‍රී අබේසිරි මහත්මිය, මුදල් අමාත්‍යාංශයේ සංවර්ධනය පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රලේඛන) හැරිසන් සිල්වා මහතා, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාර සරෝජිනී මීවැව මහත්මිය හා ශ්‍රී ලංකා මහ බැංකු පුස්තකාලයේ රංජනී මංගලිකා ප්‍රනාන්දු මහත්මිය මෙම පාඨමාලාවට සහභාගි වෙති. ජූනි මස ඇරඹුනු මෙම පාඨමාලාව ජූලි මස අග දක්වා පැවැත්වේ.

## ප්‍රදර්ශනයක්

ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සංගමය, මුද්‍රිත දින දර්ශන, දින පොත්, සුභ පැතුම් හා පොත් කවර ප්‍රදර්ශනයක් කොළඹ කලා භවනේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තිබෙන ඒ ඒ මුද්‍රණ වර්ග වලින් හොඳම නිමාවෙන් යුතු මුද්‍රිත ප්‍රකාශනයන් සඳහා සම්මාන පිරිනැමීමක් සිදු කිරීමට සංගමය බලාපොරොත්තු වනු ලැබේ.

## සම්මන්ත්‍රණයක්

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය ගුරු ලේඛක, ලේඛිකාවන් සඳහා පොත් නිෂ්පාදනය, ප්‍රකාශනය, මුද්‍රණය හා අලෙවිය පිළිබඳව සම්මන්ත්‍රණයක් කොළඹ බෞද්ධාලෝක මාවතේ විද්වත් වෘත්තීය සංගම් මධ්‍යස්ථානයේ දී මැයි 05 සහ 06 දින තුල පවත්වන ලදී.

# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

ශ්‍රී ලංකාවේ පළ වන ග්‍රන්ථ පිළිබඳ විස්තර විෂය, කතෘ හා ග්‍රන්ථ නාම යටතේ ඉතා පහසුවෙන් බලා ගැනීම සඳහා

# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

(ත්‍රෛමාසික)

ලබා ගැනීමට පහසුම මඟ දායක වීමයි.

★ පුස්තකාලයාධිපතිනට
★ ආයතනවලට
★ ප්‍රකාශකයනට

ඉතාමත් අවශ්‍ය ග්‍රන්ථයකි.

## වාර්ෂික දායක මුදල රු. 80.00 කි.

(තැ. ගා. සමග)

**මුදල් හා චෙක්පත්:**– සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, තැ. පෙ. 1764, නිදහස් මාවත, කොළඹ. යන ලිපිනයට යොමු කරන්න.

**සියලු විමසීම්:**– සභාපති ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

(පහත සඳහන් කූපනය පුරවා මුදල් සමග එවන්න.)

---

කූපනය

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය.

නම.................................................................... දුරකථන අංකය.....................

ලිපිනය....................................................................................................

(රාජකාරි / පුද්ගලික)

මේ සමග රු:...........................................ක් වටිනා අංක ..................................දරන

චෙක්පත / මුදල් ඇණවුම / තැපැල් ඇණවුම වශී......................................................ක්

කලාපය / කලාප අංක.. ..........................සඳහා එවා ඇත.

දිනය.................................... ................................................

අත්සන

# ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය
# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් 1988 වසරේ අප්‍රේල් සිට ජුනි දක්වා පළ කර ඇත.

| | | |
|---|---|---|
| **බුද්ධාගම** | | |
| Dr. W. S. KARUNARATNE | THE THEORY OF CAUSALITY | 60. 00 |
| **විද්‍යාව** | | |
| සරත් විජේසූරිය | නවලොවකි විද්‍යාවකි | 21. 00 |
| **සාහිත්‍යය** | | |
| ප්‍රේමචන්ද්‍ර මාගම්මන | සිංහල නවකතාවේ නව නැම්ම | 38. 40 |
| **නව කතා** | | |
| කේ. ජී. කරුණාසේන | බිම් මහල | 35. 40 |
| ආනන්ද ගුණරත්න | කඩදාසි බෝට්ටු | 21. 00 |
| **කෙටි කතා** | | |
| හෙ. වි. කුලසේකර | තාණ්ඩව හා ලාස්‍යය | 18. 00 |
| **පරිවර්තිත කෘති (පද්‍ය)** | | |
| කරුණාතිලක හඳුන්පතිරන (විදේශීය කවීන්ගේ පද්‍ය පරිවර්තනයකි) | හෙට මනමාලිය | 30. 00 |
| **පරිවර්තිත කෘති (නාට්‍ය)** | | |
| සිරිල් සී. පෙරේරා | මකර රාක්ෂස | 33. 00 |
| **පරිවර්තිත කෘති (කෙටි කතා)** | | |
| අයිලින් සිරිවර්ධන | විසිවන සියවසේ කෙටිකතා | 39. 00 |
| **ඉතිහාසය** | | |
| මහාචාර්ය ජේ. බී. දිසානායක | සිංහල වෙහෙර විහාර | 38. 00 |
| වී. ජී. කුලතුංග | මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධාන | 42. 00 |

ඉහත සඳහන් සියලුම කෘති විශේෂ වෙළඳ වට්ටම් යටතේ මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල හා සුභ සාධක පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිළදී ගත හැකිය.

# NEW VISTAS IN INFORMATION TECHNOLOGY

L. A. JAYATISSA

Department of Library and Information Science
University of Kelaniya,
Kelaniya.

One of the best ways to analyse the future trends in librarianship is to view these in relation to its past, present and the future. In this perspective we can clearly identify the changes that have occured in both degree and kind. The ancient libraries in Alexandria had collections of clay tablets as its primary source of information, and the medieval monastic libraries in Sri Lanka, popularly known as "Pothgul" had extensive collections of hand written ola leaf manuscripts. Even though the physical form of these materials differed significantly, the basic purpose of application remained same. That is to preserve the knowledge acquired by one generation for the use of an another generation. However, the process of transfer of information became more complicated with the advancement of the society. Ever since the invention of movable-block printing by Gutenberg, the recorded literary output generated through the process of education research and social activities rose to unprecedented levels, thus requiring the use of hitherto un-utilised electronic and other media to cope the demands.

It is now recognised that information plays a very important role in national development. Just two decades ago, the symbol '3M' was used to denote Money, Material and Men in describing the resources. Today, the factor 'Information' has come on par with these three resources. The emergence of information as an important resource lead to the beginning of another frontier in technological development, "Information Technology". This embraces the current developments in the fields of Electronics, Reprography, Computer technology, Audio and Video technology, Telecommunications technology and the Laser technology. The successful convergence of all these technologies to develop an efficient media for information handling lead to some new discoveries, bringing the personnel associated with the dispense of information to the forefront of the technological innovations. One such important product is the 'Optical Disc'.

During the recent years, optical disc technology and its use for storage of machine readable data drew much attention among the people concerned with information handling. This technology has been available for a little over a decade, but only recently have standards been agreed for any type of optical disc. Unlike in the other type of discs (which we know popularly as records) which was primarily used to record high-fidelity music, digital technology was used to record and reproduce sound, in these discs. These discs were compact in size, and hence it was appropriately named "Compact-Disc" (CD). In the early stages of its development, CD's were used as a medium for the distribution of pre-recorded information. Thus the accronym 'CD-ROM' was used to describe these discs, embodying the words 'Compact Disc-Read Only Memory'.The ROM devices can be best explained by normal pre-recorded music records. In these records, the sound signal is already recorded by the manufacturer, and the user can play it repetatively. The user cannot re-record over it, as in the case of normal cassette tapes. This type of re-recordable storage devices are known as RAM's.

In the conventional form of discs, the sound signal is recorded in a form of a groove which is analogues to the signal it reproduced. In CD-ROM's the signal is expressed or encoded in the binary form consisting only 1's and O's. This way, a complex sound signal can be encoded into a series of 1's and O's. This digital translation of the sound signal (or the digital image) is imprinted onto the surface of the CD-ROM using a laser beam to create a precise landscape of pits and ridges, each corresponding to 1's and O's.

The user's CD player reads the landscape of pits and ridges recorded on it by a low power laser beam off the surface of the disc and measures its reflection. This result is processed in the amplifier unit and the sound signal is reproduced. The fidelity of sound is not lost from the original, due to the exact coding and de-coding process.

The digital age of audio technology arrived in 1982, with the introduction of the first consumer oriented CD player. In 1984, by applying ultra-dense circuit packaging technologies, Sony Corporation developed a portable CD player, thus helping broaden the range of applications for CD players from high-fidelity components for the home to more portable equipment such as cassette recorders. Today, a broad lineup of CD players including console type players, players for automotive use and hybrid products combining CD players with mini-component systems or radio cassette recorders are manufactured by an array of companies.

Since the reading is done by a laser beam and there is no stylus or magnetic head to touch the surface of a CD-ROM, its usable life span is far more longer than its traditional counterpart, the conventional disc. But it is the vast storage capacity of the CD-ROM, which paved way for its subsequent development as a medium for use with computers. Each disc has the storage capacity of 600 Megabytes, equivalent to two hours of music quality sound or sixteen hours of speech quality sound or thousand photo quality images. In real terms, this is the equivalent of about 225,000 pages in searchable text or 5000 facsimile quality images, that are not directly searchable. This massive storage capacity is further illustrated by the fact that it can contain 1,600 floppy discs or 1,200 microfiches.

It is important to note that its very ability of higher storage capability was used as a counter argument against the use of CD-ROM's. The economic use of a CD-ROM was argued on ground of its higher storage requirements o[illegible] large work to be handled, to justify its use back as in 1984, a disc 30cm in diameter co[illegible] upto 20,000 pages of A-4 size, with a retr[illegible] of 10 seconds with the aid of software. retrieval time was made possible due to tional storage space left in each CD-RO[illegible] space on the disc will be used by the software required to search the data stored in it. Finally, this space can be used to make the product user-friendly by making it easier to use through the introduction of a help facility and training information on the same disc.

The average cost of creating a CD-ROM is around $ 5,000 a disc. This is related to the creation of the master disc. Its subsequent reproduction or copying is done by pressing with a die. The replication cost is said to be between $ 7 - 10 per disc. This final copying has no relationship to the information content in each disc.

Another area of cost consideration is the acquisition of hardware. At present, Denon, Hitachi, Panasonic, Philips, Sony and Toshiba companies are among the major manufacturers of CD players, with price tags starting from $ 1,000. However, with the availability of more CD-ROM products, the range of equipment available for consumers will be wider with prices falling even further. This price trend has been observed in the case of other electronic items including audio and video products.

At present, there are about 300 CD-ROM products available in the industry. Most of these products are originated in the United States, and many are having an international appeal. The first products to emerge in CD-ROM format were mainly aimed at the Information Scientist and contained reproductions of online databases. This has changed since then, and presently an array of products are available for consumers. These include educational encyclopedias, dissertation abstracts, medical literature, book and serial references, newspaper archives patents, computer documentation, software etc. Some of the products to be available in late 1987 includes the British Books in Print, the Post Office Directory (UK), The Financial Times, the Library and information Science Abstracts (LISA), the Commonwealth Agri[illegible]

available. These includes all formats of MARC. Networks and Regional Databases, Retrospective Conversion to OCLC, REMARC and UTLAS. Library of Congress Subject Headings. Book Selection Tools including Book Reviews and Publishers Catalogs, and System Interfaces.

Unlike in other media, CD-ROM features the special ability to store a mixture of media including images, data and sound. This advantage coupled with rapid random access and interface ability to personal computers will enable any individual to possess a library of several thousand volumes in his home or office.

CD-ROM can be regarded as the first commercial computer application of the CD medium. There are also other CD and non CD optical media still being developed. One such medium is CD-I developed by Philips. In its physical form it is exactly the same as CD-ROM, but for its data representation and retrieval method. CD-I is not as flexible as CD-ROM, having a rigid pre-defined structure in contrast to the many different types of retrieval software and data file structures of CD-ROM. This rigidity will enable to reap a distinct advantage in the use of same software irrespective to the manufacturer or the publisher of CD product. Therefore, products from different suppliers will not require seperate software packages.

Another promising products are CD-PROM (Programmable Read-Only Memory) and WORM (Write Once Read Many) which have appeared [illegible] on the

The latest technological innovation in this frontier is the development of erasable and re-recordable CD. A prototype is developed and this advanced medium is expected to be unveiled for commercial use in 1989.

The impacts of the new range of products will be far reaching The compactness associated with higher storage capacities and fast retrieval times will undoubtedly revolutionalize information handling techniques. With storage space becoming more and more of a problem in libraries, CD-ROM will help libraians to ease congestion, specially in the periodical storage.

Another important feature in CD-ROM is the ability to publish more new editions within shorter span of time than its paper counterparts, Further, the cost of each successive edition will be considerably lower than the printed versions, thereby allowing the user to obtain regular updates. The compactness of these products will reduce expenditure on postage and handling. The following chart gives the unit cost of sending 1 Megabyte, in the event of sending 4,000 MB form Los Angeles to Boston.

| | |
|---|---|
| CD-ROM | $ 0.08 / MB |
| Tape | $ 0.21 / MB |
| Satellite link | $ 0.60 / MB |
| 9,600 BPS Telephone | $ 5.70 / MB |

This lower cost of database distribution will help to overcome the problems associated with the process of trans-national information flow.

In addition to all these new possibilities, one can expect to meet his information requirements, [illegible]hout leaving his home or office. The emergence [illegible]ese new products will change the familiar landscape of long lines of shelving stacked [illegible]oks and periodicals. However, the domi[illegible] these media over the simple and very [illegible]se of books and periodicals in the print yet to be seen.



**ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාල සංවර්ධනය පිළිබඳ පැවැත්වූ සම්මන්ත්‍රණයක්**

# ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ සියලුම ජන කොටස් වලට බලපාන විවිධ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම අරමුණු කොට ගෙන 1985 අංක 28 දරන පාර්ලිමේන්තු පනතින් ජාතික අධ්‍යාපන ආයතනය සංස්ථාපිත කර ඇත.

මෙවැනි ආයතනයක් සඳහා සංවිධානය කළ යුතු පුස්තකාල සහ ප්‍රලේඛන සේවාව එම ආයතනයේ මූලික අරමුණු සහ අවශ්‍යතා මත ගොඩනැගිය යුතු බැවින් තත් අරමුණු සැකෙවින් පහත සඳහන් කෙරේ.

i ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනය සඳහා වූ සැලසුම් හා වැඩ සටහන් නිර්මාණය කිරීම.

ii අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, ව්‍යුහය, විෂයමාලා සැකසීම අධ්‍යාපන ක්‍රම පිළිබඳව ද, අධ්‍යාපනයේ සමාජමය වූත්, ආර්ථිකමය වූත්. කරුණු ගැන ද අඛණ්ඩ අධ්‍යාපනයක් හා ඇගයීම් පවත්වා ගෙන යාම.

iii අධ්‍යාපන කාර්යය සඳහා අවශ්‍ය කාර්මික ඥානය අනුවර්ධනය කිරීම, අධ්‍යාපන පද්ධතියේ නවීකරණය ක්‍රියාවලියක් සැලසුම් කිරීම හා අදාල ක්ෂේත්‍රවල කාර්ය මණ්ඩලයේ වෘත්තීය හා කළමණාකරණයේ නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම.

iv විශේෂඥ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි මට්ටමේ පාඨශාලා පැවැත්වීම හා රට අවශ්‍යතා නිර්ණය කොට ඒවා ක්‍රියාත්මක කිරීම හා අධ්‍යාපන පර්යේෂණ කටයුතු කරගෙන යාම.

ඉහත සඳහන් කාර්යයන්වල සාර්ථක පල ලබා ගැනීමට ප්‍රවීණ පුස්තකාල සහ ප්‍රලේඛන සේවාවන් නියමිත වශයෙන් ම අවශ්‍ය වන අතර එම සේවාවන් නවීන ප්‍රමිතීන් අනුව සංවිධානය විය යුතු ව ඇත. මෙම ආයතනයේ විශේෂිත පාඨක භවතුන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා හඳුනා ගැනීමටං සහ එම අවශ්‍යතා උපරිම අයුරින් සපයා දීමේ ප්‍රධාන කාර්ය භාරය හිමි වන්නේද ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන පුස්තකාල සේවාවට ය.

ජාතික අධ්‍යාපන ආයතනයේ මූලස්ථානය පිහිටුවා ඇත්තේ මහරගම ගුරු විද්‍යාල භූමි ප්‍රදේශයේ ය. එහි අනුබද්ධ ආයතනයක් වන අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරන අංශය, දුරස්ථ අධ්‍යාපන අංශය හා විෂයමාලා සංවර්ධන අංශය විසින් වෙන් වෙන් වශයෙන් ශාඛා පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යනු ලැබේ. මෑතකදී රුපියල් ලක්ෂ 10 ක් පමණ වැය කොට නවීකරණය කරන ලද මහරගම ගුරු විද්‍යාල පුස්තකාලය ජාතික අධ්‍යාපන ආයතනයේ මධ්‍යම පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය වශයෙන් ප්‍රතිසංවිධානය කරගෙන යමින් පවතී. ඉහත සඳහන් විවිධ අංශ මගින් වෙන් වෙන් වශයෙන් පවත්වා ගෙන යන ශාඛා පුස්තකාල සේවාවන් මධ්‍යගත කොට ඒවායේ අඩංගු සම්පත් සහ ද්‍රව්‍ය සම්භාරය පාඨකයන්ගේ උපරිම ප්‍රයෝජනය සඳහා සංවිධානය කිරීමේ කාර්යය දැනටමත් ආරම්භ කර ඇත.

නවීනතම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුරූප වූ තාක්ෂණ ක්‍රම උපයෝගි කර ගනිමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් මට්ටමේ ප්‍රලේඛන සේවාවන් හා තොරතුරු රැස්කිරීමේ හා බෙදා හැරීමේ මාර්ග සැලකිල්ලට ගෙන පාඨකයන්හට උපරිම සේවාවක් ලබාදීම ආයතනයේ පුස්තකාල සහ ප්‍රලේඛන සංකීර්ණයේ ප්‍රධාන වගකීම සහ අරමුණු බව මෙහිලා සඳහන් කළ හැකිය.

2 වැනි පිටුවෙන්

## පියදාස මහතාගේ . . . .

ජාතික වශයෙන් පුස්තකාල සංවර්ධන, ග්‍රන්ථ සංවර්ධන සහ ප්‍රකාශන ක්ෂේත්‍රවලට පුළුල් ලෙස පියදාස මහතා සම්බන්ධ විය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආරම්භක සභාපති වරයා වශයෙන් කටයුතු කළ එතුමා පුස්තකාල සංගමයේ කටයුතු සහ විශේෂයෙන්ම එහි අධ්‍යාපනික කටයුතු විද්‍යානුකූලව සංවිධානය කරලීමට පුරෝගාමී විය. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ කටයුතු වල ද දීර්ඝ කාලයක් ඒ මහතා නිරත විය. විශ්ව විද්‍යාලයීය මට්ටමින් පුස්තකාල විද්‍යා අධ්‍යාපන කටයුතු සංවිධානය කරලීම පිළිබඳව 1972 වසරේ දී පත් කරන ලද කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ද පියදාස මහතා කටයුතු කළේය. පසුව කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා අධ්‍යාපන අංශයක් පිහිටුවීමට තීරණය කළ පසු ඒ කාර්යය සාර්ථක කර ගැනීමේ ලා පියදාස මහතා විශාල උනන්දුවකින් කටයුතු කළේය. පුස්තකාල විද්‍යා අධ්‍යාපන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස විශ්‍රාම යන තෙක්ම කටයුතු කළ ඒ මහතා අවස්ථා ගණනකදීම මෙම අධ්‍යාපන අංශයේ ප්‍රධානියා වශයෙන් ද කටයුතු කර ඇත.

ඒ මහතා ලියූ 'පුස්තකාල විද්‍යා ප්‍රවේශය' මෙම විෂය ක්ෂේත්‍රයේ ප්‍රථම සිංහල ග්‍රන්ථය ලෙස සැලකේ. ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ ගත කළ කාලය තුළ පශ්චාත් උපාධි නිබන්ධනය වශයෙන් සම්පාදනය කොට, මෑතකදී ප්‍රකාශයට පත් කළ LIBRARIES IN SRI LANKA, ORIGIN AND HISTORY' ඒ මහතා අතින් ලියවුණු අගනා පර්යේෂණ කෘතියකි. ලංකාවේ පුස්තකාල ඉතිහාසය පිළිබඳ ලියවුණු එකම පර්යේෂණ කෘතිය මෙය වේ.

ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට පියදාස මහතාගෙන් සිදු වූ විශිෂ්ට සේවය අගය කිරීමක් වශයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් එහි ගෞරව අධි සාමාජිකත්වයක් 1987 වසරේදී එතුමාට පිරිනමන ලදී.


# පුස්තකාල ප්‍රවෘත්ති

ත්‍රෛමාසික ප්‍රකාශනය

ආරම්භය : 1973

**සංස්කරණය හා ප්‍රකාශනය :**

පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

සැ. යු.

**මෙම ප්‍රකාශනයෙහි පළවන ලිපිවල සඳහන් අදහස් අනිවාර්යයෙන් ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම් අදාල ලේඛකයන් වෙත පැවරේ.**

| | | |
|---|---|---|
| **කලාපයක මිල** | **රු:** | **5. 00** |
| **වාර්ෂික දායක මුදල** | **රු:** | **20. 00** |
| **(තැ. ගා. සමග)** | | |

දායක මුදල්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

විමසීම් හා ලිපි :

සභාපති

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**

නිදහස් මාවත, කොළඹ 7.

ටෙලි. 598847

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ගල්කිස්ස, ඩබ්ලිව්. ඩී. සී. (ප්‍රින්ටර්ස්) හි මුද්‍රණය කරවන ලදී.

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*